# [උ] ගෙවුම් ශේෂය හා විදේශීය වත්කම්

ලංකාවේ ගෙවුම් ශේෂය සහ විදේශීය වත්කම් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා පරිශිෂ්ඨයෙහි අංක: 30 සිට 34 දක්වා සංඛ්‍යා සටහන්වල දක්වා ඇත. ගෙවුම් ශේෂය පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත්තේ වර්ෂය තුළ දී වූ නියම ලැබීම් සහ ගෙවීම් දක්වෙන විනිමය පාලන වාර්තා වලිනි. මෙම තොරතුරු, රේගු වාර්තා පදනම් කොට සැකැසුනු විදේශීය වෙළෙඳ අංශය හා සම්බන්ධ කොටසේ සංඛ්‍යාවන්ගෙන් වෙනස්වනු ඇත.

## 1. ප්‍රතිපත්ති

1967 සහ 1968 වර්ෂ තුළ දී පනවන ලද ප්‍රධාන විනිමය ප්‍රතිසංස්කරණ දෙකක් ලංකාවේ ගෙවුම් ශේෂයෙහි 1968 දී උද්ගත වූ උපනතීන් වෙත බලපා ඇත. 1967 නොවැම්බර් 22 වැනි දින ලංකා රුපියල සියයට 20 කින් අව ප්‍රමාණය කරන ලදී. ගනුදෙනු රාශියක් සම්බන්ධයෙන් විදේශ විනිමය අනුපාතිකයෙහි අගය තවත් අඩු කළ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය 1968 මැයි මස 6 වැනි දින පිහිටුවන ලදී. ඒ සමගම ආනයන හා විනිමය පාලන ප්‍රතිපත්ති ලිහිල් කිරීම සඳහා විධිවිධාන යොදන ලදී. සැලකිය යුතු භාණ්ඩ සංඛ්‍යාවක් විවෘත පොදු බලපත්‍ර[1] යටතට පත් කළ අතර, ලාභ සහ ලාභාංශ ප්‍රේෂණය වැනි සමහර ගණවලට අයත් වන ප්‍රේෂණ ලිහිල් කරන ලදී. නිමැවුම වැඩි කිරීම සහ වඩාත් තාත්වික පදනමක් අනුව දේශීය වස්තු උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය වන අනුබලය සැපැයීම සඳහා මූල්‍ය, පිස්කල්, හා නිෂ්පාදන අංශයන්හි අනුපූරක විධිවිධාන පනවන ලදී. ලංකාවේ විදේශීය ලැබීම් සහ ගෙවීම් වල අතුල්‍යතාවය නිවැරදි කිරීමට හා කාලයක් තිස්සේම පැවති ලංකාවේ විදේශීය විනිමය සංචිත වෙත වූ පීඩන අඩු කිරීම අරමුණු කොට ගෙන මෙම සියලු විධිවිධාන සකස් කරන ලදී. යොදා ගන්නා ලද විධිවිධාන සහ එම විධිවිධානවල ක්‍රියාවලිය, මෙම වාර්තාවේ වෙනත් තැනක විස්තරාත්මකව සාකච්ඡා කෙරෙනු ඇත. ලබා ගැනීමට හැකි සාධකවලින් දක්වෙනුයේ 1967 සහ 1968 වර්ෂ වල දී ආර්ථික අතින් ගත් ප්‍රතිපත්ති හා විධිවිධාන ගෙවුම් ශේෂය කෙරෙහි යහපත් ලෙස බලපෑ බවය.

දශකයකටත් වැඩි කාලයක් තිස්සේ ලංකාවේ ගෙවුම් ශේෂයෙහි හිඟකම් පැවතුනි. ගෙවීම් හිඟවලින් මූලික වශයෙන් පිළිබිඹු වනුයේ, යම් වර්ධන අනුපාතිකයක් වෙනුවෙන් රටෙහි අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ආර්ථිකයට ලබා ගත හැකි ආර්ථික සම්පත් පරිමාව ප්‍රමාණවත් නොවීමය. එසේ හෙයින්, රටට හිමි විදේශීය වත්කම්, කෙටිකාලීන ණය හෝ ආධාර ස්වරූපයෙන් පැමිණෙන විදේශීය සම්පත්, දේශීය සම්පත් වලට අතිරේකව යොදා ගැනීමට අවශ්‍ය වනු ඇත. මෑත වර්ෂවල දී ආයෝජනවල වේගය සීඝ්‍ර වූයෙන්, ආනයනය කරනු ලබන පාරිභෝජන භාණ්ඩවල සංඛ්‍යාව හා පරිමාව සීමා කිරීමෙන් තරමක ආත්ම පරිත්‍යාගයක් කිරීමට සිදු විය. ඒ සමග ම අත්‍යාවශ්‍ය අමු ද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාණ්ඩ අපනයන කිරීම සඳහා වැඩි වූ විදේශීය විනිමය ප්‍රමාණය යොදවන ලදී. ඒ කෙසේ වෙතත්, ලංකාවේ ජනගහනයෙහි සීඝ්‍ර වැඩිවීම හා මූල්‍ය ප්‍රසාරණය හා ආදායම් ප්‍රති ව්‍යාප්තිය හේතු කොටගෙන, රටෙහි මූල්‍ය ආදායම් හි ඇති වූ ප්‍රසාරණය, පාරිභෝගික භාණ්ඩ අපනයනය විශාල ප්‍රමාණයකින් අඩු කිරීමේ හැකියාව තරමක් දුරට සීමා කළේ ය. එහෙයින්, අපනයනය සඳහා ඉල්ලුම් ස්වරූපයෙන් රටෙහි විදේශීය විනිමය සංචිත වෙත වූ ආරම්භක පීඩන, විදේශීය විනිමය පාවිච්චිය දැඩි ලෙස පාලනය කිරීමෙන් සහ සලාක කිරීමෙන් මර්ධනය කිරීමට සිදු විය.

කලක සිට පවත්වා ගෙන ආ දැඩි ආනයන හා විනිමය පාලන ආර්ථිකය කෙරෙහි බල පවත්වන බැව් 1967 වන විට වැටහිණි. ව්‍යාකූල වූ ආනයන හා විනිමය පාලන ක්‍රමයක් ක්‍රියාවේ යෙදීම හා සම්බන්ධ බරපතල පරිපාලන ප්‍රශ්න හා විනිමය දූෂණ ක්‍රියාවල යෙදීම සීඝ්‍ර ලෙස වැඩිවීම හැරුණු විට, විදේශීය විනිමය බෙදීමේදී අනම්‍ය සලාක ක්‍රමයක් අනුගමනය කිරීම, අකාර්යක්ෂම හා එතරම් සාධාරණ නොවන ක්‍රමයක් බව එක වර ම පෙනී ගියේ ය. උදාහරණයක් දක්වතොත්, ආයෝජන හා නිෂ්පාදනය සඳහා ආනයන කළ අමු ද්‍රව්‍ය මත රඳා පවත්නා, කර්මාන්තවල හා කෘෂිකර්මයෙහි, වඩා ක්‍රියාකාරී අංශයන්හට, වඩා ලාභ ලබා ගත හැකි අන්දමින් යෙදවීම සඳහා, අවශ්‍යතරම් විදේශීය විනිමය වෙන් කිරීම් නො තිබිණ. ලංකාවේ ප්‍රධාන අපනයන වෙනුවෙන් අසතුටුදායක මිල ගණන් ලෝක වෙළෙඳ පොළෙන් ලැබීම හා ආනයන සඳහා වූ ඉල්ලුමෙහි ප්‍රසාරණය ඊට සමග සංයුක්තවීම හේතුකොට ගෙන ඇයගේ විදේශීය විනිමය ඉපැයීම් දිගටම පිරිහුනෙන්, විදේශ විනිමය සඳහා ලංකා රුපියල්වලින් ඇත්ත වශයෙන් හිඟකම් මිලක් ඇති විය. එසේ වුවද, වැඩි වූ හිඟකම් මිල නිල විනිමය අනුපාතකය කෙරෙහි බලපෑමක් ඇති නොකළ අතර දැඩි වූ විදේශ විනිමය සලාක ක්‍රමයක් මගින් එය කෘත්‍රිම ලෙස යටපත් කරන ලදී.

1. විවෘත පොදු බලපත්‍ර ගණයේ ආනයන වනාහී තනි ආන බලපත්‍රයන්ගෙන් නිදහස් කරනු ලැබූ ආනයනයන් වෙයි.

එහෙයින්, 1967 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල අවප්‍රමාණ කිරීම හා 1968 මැයි මාසයේ දී විදේශීය විනිමය හිමිකම් බලපත්‍ර ක්‍රමය ඇතිකිරීම, ලංකාවේ අර්ථක්‍රම ය, විදේශීය විනිමය සඳහා වූ නියම හිඟකම් මිල වෙත යොමු කිරීම සඳහා ගන්නා ලද වැදගත් ප්‍රතිපත්ති විධිවිධානයන්ය. ලංකාවේ ආදායම් ව්‍යාප්තියෙහි තවමත් සැලකිය යුතු වෙනස්කම් ඇති බව පෙනීයන හෙයින්, අර්ථ ක්‍රමයේ, සමහර පාරිභෝජක හා නිෂ්පාදන අංශයන් වෙත රැකවරණය සැලැසීම සඳහා, අත්‍යාවශ්‍ය ආනයන වැඩි හරියක් හා සමහර වර්ගවල සේවා සහ ප්‍රාග්ධන ගෙවීම්, විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය වෙතින් නිදහස් කරන ලදී. රටෙහි විදේශීය ගෙවීම් දැඩි පාලන මගින් හික්මවෙන තාක් හා එහි ගෙවීම්වලින් සැලකිය යුතු කොටසක් 1968 වර්ෂයේ දී ඇති කරන ලද විනිමය ප්‍රතිසංස්කරණවල බලපෑමෙන් ආවරණයව පවතින තාක්, නිවැරදි කිරීමේ විනිමය විධිවිධානවල වැදගත්කම හා බලපෑම පිළිබඳව සතුටුදායක ඇගැයීමක් කළ නොහැකි ය. කෙසේ වෙතත්, විනිමය සංචිත පාවිච්චි කිරීමේ දී තාත්වික භාවයක් හා ප්‍රශස්ත තත්වයට පත්වීමක් සිදු වී ඇති බැව් 1968 වර්ෂයේ දී ලංකා අර්ථ ක්‍රමයෙහි ක්‍රියා කාරිත්වය පිළිබඳ මූලික දර්ශක හා රටෙහි ගෙවුම් ශේෂය කෙරෙහි වූ අනුරූපී බලපෑම් වලින් දැක්වේ.

විදේශීය විනිමය සම්බන්ධයෙන් රටක ව්‍යවහාර මුදල අවප්‍රමාණ කිරීමේ සාර්ථකත්වය ම, එහි ප්‍රතිවිපාකයක් වශයෙන් ගෙවුම් ශේෂයේ හිඟයෙහි දියුණුවක් දැක්විය යුතුය යන මිම්මෙන් අවසාන වශයෙන් මැනේ. ලංකාවේ විදේශ ගෙවුම් සහ ලැබීම් වලින් ප්‍රධාන කොටසක් තවමත් ආනයන සහ විනිමය පාලන යටතේ පැවතීමේ සීමාවන් ඇතිවය මෙම මිණුම් 1968 දී සම්පූර්ණ වූයේය. මෙය වඩාත් සැලකිය යුතු වනුයේ, සුභ සාධනයෙහිද අඩු කිරීමක් නොකොට ආර්ථික වර්ධනයේ ප්‍රගතිය සඳහා අවශ්‍ය වන අතිරේක සම්පත් සපයනු වස්, හිතාමතා ගෙවුම් ශේෂයෙහි හිඟයක් ඇතිවන අන්දමට වැඩ පිළිවෙලවල් යෙදීම, වර්ෂ කිහිපයක සිට පැවත ආ ප්‍රතිපත්තියක් වූ නිසාය. II (උ) 1 සහ II (උ) 2 වැනි සංඛ්‍යා සටහන්වල ලංකාවේ ගෙවුම් ශේෂයෙහි විස්තර පිළිවෙලින්, රුපියල් වටිනාකමින් සහ එක්සත් ජනපද ඩොලර්වල වටිනාකමින් දක්වා ඇත. 1967 නොවැම්බර් මාසයේ දී ව්‍යවහාර මුදල අවප්‍රමාණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1968 රුපියල් වටිනාකම් උත්පාතනය වූ අතර, එක්සත් ජනපද ඩොලර්වලින් මැනෙන අයුරු විදේශීය විනිමය සමකය, රටෙහි විදේශීය ගනුදෙනු කෙරෙහි අවප්‍රමාණ කිරීමෙහි ප්‍රතිවිපාක මැනීම සඳහා වඩා යෝග්‍ය මිණුමක් ලෙස තෝරා ගෙන ඇත. මෙම මිණුම අනුව, ලංකාවේ මුළු වෙළෙඳ හිඟය ( එනම්, ආධාර මුදල්වලින් ලබාගත් ආනයන ඇතුළුව ) 1967 දී වූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 70 සිට 1968 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 61 දක්වා අඩු විය. මෙම දර්ශකයන් විශේෂයෙන් ම වැදගත් වනුයේ 1968 වර්ෂයේ දී නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රවල වටිනාකම, රුපි. දශ ලක්ෂ 836.0 කින්, 1967 වර්ෂයේ නිකුත් කොට ඇති, බලපත්‍ර වල වටිනාකම ඉක්ම වූ හෙයිනි. ඊටත් වඩා යෝග්‍ය මිණුමක් වනුයේ ආධාර මුදල්වලින් ලබාගත් ආනයන එයින් ඉවත් කළ විටය. එසේ කළ විට, වෙළෙඳ හිඟය 1967 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 16 සිට 1968 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 4 දක්වා අඩු විය. එනම් සියයට 72 ක දියුණුවකි. වාණිජ ගනුදෙනු සම්බන්ධයෙන් වර්තන ගිණුමෙහි මුළු හිඟය ( එනම්, අදිසි සම්බන්ධ ගනුදෙනු ඇතුළුව ) 1967 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 18 සිට 1968 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 9 දක්වා පහළ වැටිණි.

කෙසේ වුවද, වැදගත් ලක්ෂණයක් වූයේ භාණ්ඩ අපනයනයෙන් සහ සේවා අලෙවි කිරීමෙන් ලද ඉපැයීම් 1967 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 391 සිට 1968 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 368 දක්වා පහළ වැටීමය. භාණ්ඩ අපනයනයෙන් ලද විදේශීය විනිමය ඉපැයීම් 1967 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 347 සිට 1968 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 332 දක්වා පහළ වැටුනු අතර, සේවා අපනයනයෙන් ලද ඉපැයීම් 1967 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 45 සිට එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 9 කින් පහළ වැටුනි. විදේශීය විනිමය අනුව බලන විට, 1968 දී භාණ්ඩ අපනයන ඉපැයීම්වල පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, තේ හා රබර්වල සාමාන්‍ය ඒකක මිලෙහි වූ පිරිහීම හා ඉකුත් වර්ෂයේ දීට වඩා සියයට 3. 6 කින් අපනයනය කළ තේ ප්‍රමාණය පහත වැටීම විය. සේවා අලෙවියෙන් ලද විනිමය ඉපැයීම් පහළ වැටීමට හේතු වී ඇත්තේ, මූලික වශයෙන්, නැව් පැමිණීම අඩුවීම කරණකොට ගෙන වරාය හා නැව්තොට ගාස්තු වශයෙන් ලැබුණු ඉපැයීම් කැපී පෙනෙන ලෙස පිරිහීමය. මෙයට තරමක් දුරට හේතුවූයේ ලංකා රුපියල අවප්‍රමාණ කිරීමෙන් පසුව ඇතිවූ වෙනස්කම් පිළිබඳ සංශෝධන ඇළතුත් නොවීම නිසාත්, සේවා ගිණුමෙහි අනෙක් සියළුම අංශ යන් හි විනිමය ඉපැයීම්, දියුණුවක් දැක්විය. 1968 අපනයනවල හැසිරීම වෙත බලපෑ සාධක සම්බන්ධව විස්තරාත්මක අගැයීමක් පසුව එන කොටසක දැක්වෙයි. විනිමය අනුපාතිකයේ වෙනස්වීමක ප්‍රතිවිපාක වඩා ඉක්මනින් බල පැවැත්විය හැක්කේ වියදම්

කෙරෙහි එහි බලපෑම කෙලින් ම සිදු වන ආනයන අංශය කෙරෙහි වන අතර, විශේෂයෙන් ම, අපනයන ව්‍යුහයෙහි මූලික නිෂ්පාදන විසින් සැලකිය යුතු තැනක් ලබා ගෙන ඇත්තේ නම්, සැපයුමෙහි ඇතිවන කාල ප්‍රමාද හේතු කොට ගෙන එය කෙරෙහි සිදු වන බලපෑම් ප්‍රමාද විය හැකිය.

අයි ප්‍රමාණික ව්‍යවහාර මුදලක විනිමය අනුපාතිකයෙහි වෙනසක් ඇති කිරීමට පක්ෂව ඉදිරිපත් කළ හැකි තවත් වැදගත් තර්කයක් වනුයේ, එවැනි වෙනසකින් උද්ගතවන ආනයනවල වැඩි මිල කරණකොට ගෙන දේශීය අංශයෙහි ඇති වන ආනයන ආදේශන ක්‍රියාවලිය සහ විශේෂයෙන් ම අධිධාරිතා ඇති කල්හි, දේශීය මුදල් අනුව සලකා බලන විට, අපනයන කෙරෙහි අවධානය යොමු වන සුළු බවය. විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමග ම, විදේශීය විනිමයෙහි වැඩි වූ මිල හා සමග කෘෂිකර්මය හා කර්මාන්ත සඳහා අවශ්‍ය වන අමු ද්‍රව්‍ය ආනයන අන්තර් භාණ්ඩසහ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය ලිහිල් කිරීම සඳහා ක්‍රමයක් ද, ක්‍රියාත්මක වූයෙන්, 1968 වර්ෂයේ දී ලංකා ආර්ථිකයෙහි එවැනි අවස්ථා සැලසුනි. මෙම වාර්තාවෙහි අන් තැනක විස්තර කර ඇති, යෝග්‍ය වූ මූල්‍ය, පිස්කල් සහ නිෂ්පාදන ප්‍රතිපත්ති වලින්, මෙම විනිමය විධිවිධාන ශක්තිමත් විණි.

## 2. උපනතීන්[1]

තාවකාලික ඇස්තමේන්තු අනුව, රුපි. දශ ලක්ෂ 1,975 ක් වන 1968 අපනයන ඉපැයීම් 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 325 ක වැඩිවීමක් දක් වීය. රුපි. දශ ලක්ෂ 59.1 ක ප්‍රති අපනයන මෙයට ඇතුලත් නැත. එක් අතකින් තේ සහ පොල් නිෂ්පාදන වල රුපියල් මිල ගණන්හි වූ වැඩිවීම් හා අනෙක් අතින් රබර් සහ පොල් නිෂ්පාදන වල පරිමාවේ වැඩිවීම, අපනයන වටිනාකමෙහි වැඩිවීමට හේතු විය. තාවකාලික ඇස්තමේන්තු අනුව ආනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,341 ක් වූ අතර, එය 1967 ආනයන මට්ටමට වඩා රුපි. දශ ලක්ෂ 356 කින් වූ වැඩිවීමකි. රුපියල් වලින් ගණන් බලන විට, අපනයන ඉපැයීම් සහ ආනයන ගෙවුම්වල මෙම සංඛ්‍යා ලංකාවේ ගෙවුම් ශේෂයෙහි මෙතෙක් සටහන් වී ඇති ඉහළ ම සංඛ්‍යාව විය. 1968 දී අපනයන හා ආනයන වටිනාකම් මට්ටම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන්, 1967 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල සියයට 20 කින් අවප්‍රමාණ කිරීමේ හේතුවෙන් සිදු වූවකි. සියළු ම ප්‍රධාන ගණයේ ආනයනවල. මිර.ගැ. මිල ගණන් වැඩිවීමහා තරමක් දුරට " ආධාර සමාජ " ක්‍රියා පිළිවෙත යටතේ ලබා ගන්නා ලද ආනයන හේතු කොට ගෙන 1967 ආනයනවල වටිනාකම් සැලකිය යුතු ලෙස වැඩි වීය. 1968 දී ආනයන වඩා ඉහළ තත්වයකට පත්වීමට තරමක් දුරට හේතු විය හැක්කේ, 1968 මැයි මාසයේ දී විදේශීය විනිමය සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, සමහර භාණ්ඩ වල ආනයනය පිළිබඳව තිබි බාධා ඉවත් කොට, එම භාණ්ඩ විවෘත පොදු බලපත්‍ර යටතට පත් කිරීම විය හැකි ය. තාවකාලික ඇස්තමේන්තු අනුව, 1968 වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි හිඟය රුපි. දශ ලක්ෂ 366 ක් වූ අතර, 1967දී වූ දශ ලක්ෂ 335ක හිඟයට වඩා සැලකිය යුතු ඉහළ යාමක් විද්‍යාමන වූයේ ය. කෙසේ වුවද, මෙම සංඛ්‍යාවන් තේරුම් ගැනීමේ දි රුපියල අවප්‍රමාණය කිරීම හේතු කොට ගෙන, 1968 දී පැවැති විනිමය අනුපාතයන් හා 1967 මුල් එකොළොස් මාසය තුළ පැවැති විනිමය අනුපාතයන් අතර වෙනස්කම් සඳහා ඉඩහල යුතු ය. උදහරණයක් වශයෙන් අපනයන සහ ආනයන වටිනාකම් ඇමෙරිකානු ඩොලර්වලට පරිවර්තනය කිරීමේ දී අපනයනයන්ගේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 332 දක්වා ඩොලර් දශ ලක්ෂ 15 කින් පහළ ගිය අතර, ආනයන වටිනාකම් ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 417 න් ඩොලර් දශ ලක්ෂ 393 දක්වා ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 24 කින් තවත් පහළ වැටුනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳ භාණ්ඩ හිඟය ඩොලර් වලින්, 1967 දී, දශ ලක්ෂ 70 න් 1968 දී දශ ලක්ෂ 61 දක්වා වර්ධනය වීය.

සංක්‍රාම ගෙවුම් ඇතුළුව, 1968 දී ලංකාවේ අදෘෂ්‍ය ගිණුම් ශේෂය 1967 දී පැවැති රුපි. දශ ලක්ෂ 46 ක අතිරික්තය හා සැසැඳීමේ දී රුපි. දශ ලක්ෂ 20 ක අතිරික්තයක් විද්‍යාමාන කෙළේය. අදෘෂ්‍ය ගිණුම පිරිහී ගියේ ආදයම් පහළ වැටීමේ සහ වියදම් ඉහළ යාමේ මිශ්‍ර ප්‍රතිඵලයෙහි හේතුවෙනි. මුළු අදෘෂ්‍ය ආදයම් (සේවා) 1967 දී රුපි. දශ ලක්ෂ 262 න් 1968 දී රුපි. දශ ලක්ෂ 254 දක්වා පහළ වැටුන අතර, මුළු අදෘෂ්‍ය ගෙවුම් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 216 න් රුපි. දශ ලක්ෂ 234 දක්වා ඉහළ ගියේ ය. අතිරික්තයෙහි පහළ වැටීමට මූලික වශයෙන් හේතු වූයේ වරාය ගාස්තු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම සහ තරමක් දුරට ප්‍රේෂණ තහනම ඉවත්වීමෙන් ආයෝජන ආදයම් ගෙවුම් වැඩිවීම සහ රජයේ වියදම් ප්‍රමාණය ඉහළ යාමය. අදෘෂ්‍ය ගිණුමෙහි කුඩා වූ අතිරික්තය අනුව වෙළෙඳ භාණ්ඩ හිඟය ගැලපීමේ දී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි වර්තන ගිණුම 1968 දී රුපි. දශ ලක්ෂ 346 ක හිඟයක් පෙන්නුම් කළ අතර, මෙය 1967 දී රුපි. දශ ලක්ෂ 289 ක හිඟය හා සැසැඳිය හැකිය. ශුද්ධ දිගු කාලීන ප්‍රාග්ධන කටයුතුවලින් වර්තන ගිණුම්

1. වසර තුලදී ඇත්ත වශයෙන්ම සිදුවූ ලැබීම් ගෙවීම් පිළිබඳව විනිමය පාලන වාර්තාවලින් ලබාගත් මෙම විශ්ලේෂණය පදනම් වී ඇත.

හිඟය හිලව් කිරීමෙන් ලැබෙන '' මූලික ශේෂය '' 1967 දී රුපියල් දශ ලක්ෂ 128 න් 1968 දී රුපි. දශ ලක්ෂ 122 දක්වා අඩු වුනි. ඩොලර් අනුව '' මූලික ශේෂය '' 1967 දී ඩොලර් දශ ලක්ෂ 26 න් 1968 දී ඩොලර් දශ ලක්ෂ 20 දක්වා අඩු වුනි. මේ අනුව මෙම ශේෂය, 1968 දී පියවිය යුතු වූ ප්‍රමාණය විය.

ලංකාවේ බාහිර සංචිතයන් ( ස්ටර්ලිං ණය නිදන් අරමුදල හැර ) 1968 දෙසැම්බර් අවසානයට රුපි. දශ ලක්ෂ 417 ක් වූ අතර, එය ඉකුත් වසර අවසානයට පැවති ප්‍රමාණයට වඩා රු. දශලක්ෂ 10 කින් අඩුවිය. මේ නිසා, රුපි. දශ ලක්ෂ 122 ක් වූ ( ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 20 ) ගෙවුම් ශේෂයේ මූලික හිඟය පියවනු ලැබුවේ විවිධ කෙටි කාලීන ණය උපයෝගී කර ගනිමින් ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් දශ ලක්ෂ 165 ක ( ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 27.7 ) ණය මුදලක් ලබාගත් අතර, විදේශ බැංකුවලින් රුපි. දශ ලක්ෂ 29 ක් ( ඇමෙරිකානු ඩොලර් 4.9 ) ලබා ගත්හ.

### 3. විදේශීය සම්පත් සහ ඒවා ප්‍රයෝජනයට ගැනීම

1968 දී ලංකාව ලත් මුළු විදේශීය සම්පත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 2,811 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 472 ) ක් වූ අතර, මෙය 1967 දී ලත් ප්‍රමාණය වූ රුපි. දශ ලක්ෂ 2,402 ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 504 ) හා සැසැඳේ. විදේශ විනිමය අනුව බැලීමේ දී, ලත් සම්පත්වල වටිනාකම ඇත්ත වශයෙන් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 32 කින් අඩු වූ බව පෙනී යනු ඇත. මේ හේතු කොට ගෙන 1968 දී ලංකාවේ ආනයන හැකියාවෙහි තියුණු පහළ වැටීමක් ඇති විය. උපයන ලද විදේශීය විනිමය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,187 ක් වූ අතර, ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 367 ) 1967 දී ඉපැයූ ප්‍රමාණය වන රුපි දශ ලක්ෂ 1,866 ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 391 ) හා සැසැඳිය හැකි ය. දේශී අපනයන සඳහා 'අපනයන ඉපැයුම්, රුපියල් වලින් දක්වීමේ දී රුපියල් දශ ලක්ෂ 1,975 දක්වා රුපියල් දශ ලක්ෂ 325 කින් ඉහළ ගිය නමුදු, එක්සත් ජනපද ඩොලර්වලින් දක්වීමේ දී, එ. ජ. ඩොලර් දශ ලක්ෂ 15 කින් පහළ වැටුනි. සේවාවන් ගෙන් ලද ලැබීම් ( නිල පැවරීම් හැර ) 1967 දී රුපි. දශ ලක්ෂ 216 න් 1968 දී රුපි. දශ ලක්ෂ 212 දක්වා ආන්තික වශයෙන් අඩු වූයේ ය. 1968 දී ලංකාව ප්‍රයෝජනයට ගත් රුපි. දශ ලක්ෂ 2,811 ක් වූ බාහිර වත්කම් ප්‍රමාණය ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 472 ) වර්ෂය තුළ දී උපයන ලද ආදයමට වඩා එ. ජ. ඩොලර් දශ ලක්ෂ 105 කින් වැඩි විය. මේ ප්‍රමාණයක බාහිර වත්කම් කොටසක් යෙදවීමට හැකි වූයේ, රට වෙත ගලා ආ විදේශාධාර ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩිවීම සහ කෙටි කාලීන වගකීම් ප්‍රමාණය සාමාන්‍ය ලෙස ඉහළ යාමත් නිසා ය 1967 දී දිගු කාලීන ප්‍රාග්ධන ගලා ඊම් රුපි. දශ ලක්ෂ 261 න් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 55 ) 1968 දී රුපි. දශ ලක්ෂ 340 දක්වා ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 57 ) වැඩි වූ අතර, මෙය, මුළු බාහිර වත්කම් ප්‍රමාණයෙන් සියයට 12 ක් වූයේ ය; 1967 දී මෙම ප්‍රමාණය සියයට 11 ක් විය. මෑත අවුරුදු වල දී නිල ප්‍රාග්ධන ගලාඊම් රටාවෙහි දෘශ්‍යමාන ලක්ෂණයක් වූයේ මුළු ආධාර ගලා ඊම්වල ණය මුදල් කොටසෙහි වැඩිවීමත් දීමනා කොටස පහළ වැටීමත්, එමගින් අනාගතයේ දී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව වෙත බලපෑමක් ඇති කිරීමත් බව 1967 වාර්ෂික වාර්තාව මගින් පෙන්වා දෙනු ලැබීය. 1968 දී ද නිල ප්‍රාග්ධන ගලාඊම් සම්බන්ධයෙන් වූ අහිතකර උපනතිය තවදුරටත් පැවතියේ ය. රුපි. දශ ලක්ෂ 37 ක (එ. ජ. ඩොලර් දශ ලක්ෂ 57 ) මුළු නිල ප්‍රාග්ධන ප්‍රමාණයකින් ණය මුදල් ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 295 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 50 ) විය. 1968 දී මෙම ප්‍රමාණය ගලා ආ මුළු නිල ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට 87 ක් වූ අතර, 1967 දී මෙම කොටස සියයට 81 ක් විය. දීමනාවන්ගේ මුළු වටිනාකම 1965 දී රුපි. දශ ලක්ෂ 64 සිට ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 13.4 ) 1968 දී රුපි. දශ ලක්ෂ 42 දක්වා ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 7.1) අනුක්‍රමිකව පහළ ගියේ ය. ගලා ආ මුළු නිල ප්‍රාග්ධන ප්‍රමාණයෙහි දීමනා කොටස, එම කාලඡේදය තුළ දී සියයට 45 සිට සියයට 12 දක්වා අඩු වූයේ ය. 1968 දී ලත් ණය මුදල්වල මුළු වටිනාකමින්, ද්‍රව්‍යාධාර වටිනාකම රුපි. දශ ලක්ෂ 273 ක් වූ ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 45.8 ) අතර කෘත්‍යාධාර වටිනාකම රුපි. දශ ලක්ෂ 40 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 6.7 ) විය.

1968 තුළ දී ලංකාව වෙත ගලා ආ දිගු කාලීන ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය ගෙවුම් හිඟය පියවීමට ප්‍රමාණවත් නොවීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම සම්පත්වලට අතිරේක වශයෙන් කෙටි කාලීන වගකීම් ප්‍රමාණය වැඩි කිරීමට සිදු විය. මෙවැනි කෙටි කාලීන ණය පහසුකම් සඳහා ප්‍රධාන මාර්ගය වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය. 1968 තුල දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගත් මුළු ණය ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 213 ක් විය. ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 36 ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගත් ණය මුදල් සමන්විත වූයේ අපනයන ආදයම් උච්චාවචන යන් සඳහා වූ වන්දි ගෙවීමේ වැඩ පිළිවෙල යටතේ ලබාගත් ණය ගැනීම් සහ ජා. මූ. අරමුදලෙහි පරිවර්තිය ණය ගැනීම් පහසුකම් යටතේ වසර තුළ දී ලබාගත් රුපි. දශ ලක්ෂ 98 ක ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 16.5 ) මුදල් ප්‍රමාණයකිනි. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්

ලබාගත් මුළු ගැනුම් ප්‍රමාණය වූ රුපි. දශ ලක්ෂ 213 න් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 35.7 ) හිඟය පියවීමට ඉතිරි වූයේ රුපි. දශ ලක්ෂ 165 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 27.7 ) පමණි. මෙයට හේතු වූයේ වර්ෂය තුළ දී අරමුදලෙන් රුපි. දශ ලක්ෂ 48 ක ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 8.1 මුදලක් ) " නැවත මිල දී ගැනීමට " ලංකාවට සිදු වීමය. මෑත අවුරුදුවල දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් මගින් කෙටි කාලීන බාහිර වත්කම් සැලකිය යුතු ප්‍රමාණයක් සැපැයිනි. කෙසේ වෙතත්, මෙම මාර්ගයෙන් ලැබෙන ශුද්ධ සම්පත් ප්‍රමාණය, මෙයට පෙර ලබාගත් ණය මුදල් නැවත ගෙවීම ආරම්භවීමත් සමගම, ඉදිරි වර්ෂයන් තුළ දී අඩුවීයාමට ඉඩ ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් ගැණුම් වලට අතිරේකව, ද්විපාර්ශ්වීය ගෙවුම්, ගිවිසුම් රටවලට ණය ගැති වීමෙන් හා විදේශීය බැංකු වලින් කෙටි කාලීන ණය ලබා ගැනීමෙන්, විදේශීය සම්පත් තවදුරටත් වැඩි කරන ලදී. මෙම මාර්ගයන් වෙතින් ලබාගත් මුදල් ප්‍රමාණ පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 42 ක් ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 7.1 ) හා රුපි. දශ ලක්ෂ 29 ක් ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 4.9 ) ක් විය. සංක්ෂිප්ත වශයෙන් කියතොත් නොයෙකුත් ගෙවීම් සඳහා 1968 දී ලංකාවට ලබා ගැනීමට හැකි වූ මුළු විදේශීය සම්පත් සියයට 78 ක් ප්‍රවර්තන විදේශීය විනිමය ඉපයීම් වලින් ද, සියයට 12 ක්, නොයෙකුත් ප්‍රාග්ධන ගලා ඊම් වලින් ද, සියයට 10 ක්, කෙටි කාලීන වගකීම් වලින් ද විය.

ඉහතින් සඳහන් කළ අයුරු, 1968 දී ලංකාවට ලබා ගැනීමට හැකි වූ විදේශීය සම්පත් රුපි. දශ ලක්ෂ 2811 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 472 ) ක් විය. මෙම මුදලින් රුපි. දශ ලක්ෂ 2341 ක් ( නැතහොත් සියයට 84 ක් ) ආනයනය කළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා යොදවන ලදී. මෙම ආනයන වලින්, ආධාර වලින් මුදල් කළ ප්‍රමාණය 1968 දී සියයට 12 ක් වූ අතර, 1967 දී එය සියයට 11 ක් විය. 1967 ආනයන වැඩ සටහන වඩාත් කැපී පෙනෙන ලෙස ආයෝජන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය වෙත යොමු වී යැයි 1967 වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. මෙම විෂයයෙහි 1968 දී ක්‍රියාකාරිත්වය ඊටත් වඩා හොඳ විය. 1967 දී රුපි. දශ ලක්ෂ 532 ක් වූ මුළු ආයෝජන භාණ්ඩ ආනයනය 1968 දී රුපි. දශ ලක්ෂ 644 දක්වා වැඩි වූ අතර, එම කාලසීමාව තුලදීම, ආනයනය කළ අන්තර් භාණ්ඩවල වටිනාකම රුපි. දශ ලක්ෂ 319 සිට රුපි. දශ ලක්ෂ 368 දක්වා වැඩි විය. එක් අතකින් රසායනික පොහොර හා ට්‍රැක්ටර් වැනි කෘෂිකාර්මික යෙදවුම් වලද, අනෙක් අතින්, යන්ත්‍ර, අමුද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය, හා ප්‍රවාහන උපකරණ වැනි කාර්මික යෙදවුම් වලද, ආනයනයෙහි කැපී පෙනෙන වැඩිවීම් දක්නට ලැබුනි. ආනයන රටාවෙහි වූ මෙම වෙනසෙහි බලපෑම් හේතුකොට ගෙන, 1968 දී ධාරිතාවෙහි පුළුල් උපයෝගීතාකරණයක් සිදු විය. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයෙහි වැඩිවීම් වලින් මෙය දක්වෙයි. සේවා ගිනුමෙහි ගෙවීම් සඳහා උපයෝගී කරගත්, මුළු විදේශීය සම්පත් රුපි. දශ ලක්ෂ 234 ක් වූ අතර, විදේශීය ණය මුදල් ක්‍රම ක්ෂය කිරීම් හා ප්‍රාග්ධන ආපසු යැවීම් විසින් රුපි. දශ ලක්ෂ 99 ක් ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 16.6 ක් ) උකහා ගන්නා ලදී. සේවා ගෙවුම් සඳහා උපයෝගී කරගත් විදේශීය සම්පත් වලින්, රු. දශ ලක්ෂ 34 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 5.7 ) ක් ආයෝජන ඉපයීම් ආපසු යැවීම් සඳහා ද, රුපි. දශ ලක්ෂ 40 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 6.7 ) ක් පොළී ගෙවීම් සඳහා ද, රුපි. දශ ලක්ෂ 27 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 4.5 ) ක් සංක්‍රාමිකයන්ගේ ප්‍රේෂණ සඳහා ද විය. අනෙක් අතට, ප්‍රාග්ධන ආපසු යැවුම් හා ණය මුදල් ක්‍රම ක්ෂය කිරීම් සඳහා උපයෝගී කරගත් සම්පත් වලින්, තෙල් සමාගම් වෙත ගෙවන ලද වන්දි වන රුපි. දශ ලක්ෂ 9 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1.5 ) කද ඇතුළු පෞද්ගලික ප්‍රාග්ධන ආපසු යැවීම් රුපි. දශ ලක්ෂ 10 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1.7 ) ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ආපසු මිලදී ගැනීම රු. දශ ලක්ෂ 48 (එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 8.1) ක් වූ අතර, විදේශීය ආණ්ඩු වෙතින් නිල වශයෙන් ලබාගෙන ඇති ණය මුදල් ආපසු ගෙවීම් රු. දශ ලක්ෂ 59 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 9.9 ක් විය.) අනෙක් සම්පත්, විදේශීය බැංකු වෙතින් ලබාගෙන තිබී රු. දශ ලක්ෂ 57 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 9.6 ) ක ණයක් ආපසු ගෙවීම සඳහා, ද රුපි. දශ ලක්ෂ 14 ( එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 2.4 ) කින් කෙටි කාලීන වගකීම් අඩු කිරීම සඳහා ද උපයෝගී කර ගන්නා ලදී.

**4. 1968 උපනතීන් සවිස්තරාත්මකව**

**(අ) වෙළඳ ගිනුම**

වෙළඳ ගිනුම පිළිබඳ සවිස්තරාත්මක උපනතීන්, වාර්ෂික වාර්තාවේ විදේශීය වෙළඳාම පිළිබඳ කොටසෙහි විග්‍රහකොට තිබේ.

**(ආ) අදිසි ගිනුම**

1965 දී අදිසි ගිණුමෙහි රුපි. දශ ලක්ෂ 72 ක අතිරික්තයක් ලංකාවට අයත්ව තුබුණි. මෙම අතිරික්තය වර්ෂයෙන් වර්ෂයට ක්‍රම ක්‍රමයෙන් පහත වැටී ඇති අතර, තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 1968 දී මෙම අතිරික්තය රුපි. දශ ලක්ෂ 20 ක ප්‍රමාණයට සීමා වී ඇත. අදිසි ගිණුම වෙත වූ මුළු ලැබීම් 1968 දී රුපියල් දශ ලක්ෂ 8 කින් පහත වැටිණි. මේ අතර, මුළු ගෙවීම් ප්‍රමාණය 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 18 කින් වැඩි වී ඇත. මෙහි ප්‍රතිඵලයන් වශයෙන් 1968 දී අදිසි ගිණුම් ඉකුත් වසරට වඩා රුපි. දශ ලක්ෂ 26 කින් පිරිහුණි.

1968 අදිසි ගිණුමෙන් වූ ගෙවීම් පරිමාව වැඩිවීමට හේතු වූ කරුණු කීපයක් විය. ආයෝජන ආදයම නිසා බැහැර වූ ප්‍රමාණය 1967 දී රුපි. දශ ලක්ෂ 65 ක්ව පැවැති අතර 1968 දී රුපි. දශ ලක්ෂ 74 දක්වා වැඩි විය. ආයෝජන ආදයම කෙරෙහි වූ ප්‍රේෂණ තහනම ලිහිල් කිරීම නිසා 1966 දී රුපි. දශ ලක්ෂ 26 ක් වූ පිටාර ගලා යෑම 1967 දී රුපියල් දශ ලක්ෂ 34 ක් විය. විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය ඇරඹීමත් සමග ම වර්තන ආදයම් සම්බන්ධයෙන් ප්‍රේෂණ තහනම මුළුමනින් ම ඉවත් කිරීම නිසා 1968 දී පිටාර ගලා යෑම තවත් ප්‍රබල විය. මෙම ගිණුමෙහි ගලා යෑම ඩොලර් අගය අනුව 1967 ලත් සංඛ්‍යාවේ සිට 1968 දී එ. ජ. ඩොලර් දශ ලක්ෂ 6 දක්වා විය. ලාභාංශයෙන් සහ ලාභ ප්‍රේෂණ සඳහා ද දැනට විදේශ විනිමය සහතික පත් බාර දිය යුතුව ඇත. ලංකාවේ ගෙවුම් ශේෂයේ අදිසි ගිණුමින් ඉස්මතු වී පෙනෙන තවත් වැදගත් ලක්ෂණයක් වනුයේ විදේශීය ණය සේවාව සඳහා අවශ්‍ය වන පොළී ගෙවීම්වල සමුච්චිත වැඩිවීමයි. මෙකී මිගින් වූ මුළු ගෙවීම 1967 පැවැති රුපි. දශ ලක්ෂ 33 ක් සිට 1968 දී රුපි. දශලක්ෂ 40 දක්වා වැඩි විය. මෙය මෑත වර්ෂවලදී විදේශීය ආර්ථික ආධාර උපයෝගී කර ගැනීම වැඩිවීමේ ස්වභාවික ප්‍රතිඵලයකි. එහෙත් මෙය තවමත් මුළු විදේශීය විනිමය ලැබීම්වල අනුගමයන් වශයෙන් දැක් වූ කල, සාපේක්ෂිත වශයෙන් සුළු ප්‍රමාණයක්ව පවතී. 1968 දී රජයේ වියදම් වෙනුවෙන් වූ ලංකාවේ පැහැදමේ සුළු වැඩිවීම දක්නට ලැබිණි. මේ අතර සංක්‍රාමිකයන්ගේ පැවැරුම් හේතු කොට ගෙන ගිණුමෙන් කළ ගෙවීම් ආන්තික වශයෙන් අඩු විය. ප්‍රවාහන ගිණුමින් ලැබීම්, සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම නිසා අදිසි ගිණුමේ ලැබීම් අංශය පිරිහී තිබුණි. මේ අතර, මෙම ගිණුමෙහි ලැබීම්වල වටිනාකම 1967 පැවැති රුපි. දශ ලක්ෂ 130 සිට 1968 දී රුපි. දශ ලක්ෂ 117 දක්වා අඩු විය. මේ අතර, මෙම ගිණුමෙහි අතිරික්තය රුපි. දශ ලක්ෂ 115 සිට රුපි. දශ ලක්ෂ 102 දක්වා එම කාලසීමාව තුළ දී පහත වැටුණි. ප්‍රදනයන් ගේ වටිනාකම 1967 දී රුපි. දශ ලක්ෂ 46 ක්ව පැවැති අතර, එය 1968 දී රුපියල් දශ ලක්ෂ 42 දක්වා පහත වැටීම මෙම අදිසි ඉපැයීම්වල ඇති වූ විෂම තත්වයට හේතු වූ තවත් කරුණකි.

දේශ සංචාරක වැයෙන් වූ ලැබීම් 1967 දී රුපි. දශ ලක්ෂ 6 ක්ව පැවැති අතර, 1968 දී රුපි. දශ ලක්ෂ 10 දක්වා වැඩිවිණි. 1968 මැයි මාසයේ දී විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය ඇරඹීමත් සමග ම දේශ සංචාරික ඉපැයීම්වලට අධි-විනිමය අනුපාතිකයන් සඳහා හිමිකමක් ලැබිණ. 1968 මැයි සිට දෙසැම්බර් දක්වා වූ කාල සීමාව සඳහා දේශ සංචාරකයන් ගේ පැමිණීම් හා ඉපැයීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු පිරික්සාලීමේ දී ඉකුත් වසරේ එම කාලසීමාවට වඩා ඒක පුද්ගල ඉපැයීම් එ. ජ. ඩොලර් වටිනාකම අනුව, වැඩිවීම සියයට 25.2 ක් විය.

මැයි සිට දෙසැම්බර් දක්වාවූ කාල සීමාව තුළදී දේශ සංචාරකයන් ගෙන් ලැබුනු මුළු ඉපැයීම් සංඛ්‍යාව එ. ජ. ඩොලර් අනුව ගත් කල 1967 එම කාල සීමාවේ ඉපැයුම් ප්‍රමාණය ඉක්මවා සියයට 54 ක් විය. මේ අනුව 1968 මැයි – දෙසැම්බර් කාල සීමාව තුළ දී දේශ සංචාරකයන් ගෙන් ඉපැයූ මුදල එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1.2 ක් විය. එහෙත් 1967 අනුරූපී කාල සීමාවේ ඉපැයුම ඩොලර් දශ ලක්ෂ 0.76 ක් පමණි. එමෙන් ම 1968 මැයි–දෙසැම්බර් කාල සීමාව තුළ ඒක පුද්ගල ඉපැයීම් එ. ජ. ඩොලර් 65.1 ක් වූ අතර, 1967 මෙම කාල සීමාව තුළ දී ඒක පුද්ගල ඉපැයීම්වල ප්‍රමාණයට එ. ජ. ඩොලර් 52.2 ක් විය.

දේශ සංචාරකයන් වෙත දනට ඉදිරිපත් කර ඇති සිත් ගන්නා විනිමය අනුපාතිකය නිසා කළුකඩයට අයත් වන්නට තුඹුණු දේශ සංචාරක ඉපැයීම්වලින් යම් ප්‍රමාණයක් නිල මාර්ගයන්ට යොමු කොට තිබේ. විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය සංචාරක ඉපැයීම්වල හොර ජාවාරමකට පහර ගැසීමේ එක් පියවරක් විය. ලංකාවේ දේශ සංචාරක පදනම් ව්‍යුහය පුළුල් කිරීම සඳහා දනට ගෙන ඇති ක්‍රියා මාර්ගය අනුව සලකා බලන විටත් දේශ සංචාරකයන්ට දනට ඉදිරිපත් කර ඇති වඩාත් සිත් ගන්නා විනිමය අනුපාතිකයන් නිසාත්, ඉදිරි වර්ෂවල දී මෙම සම්පත් මාර්ගයේ ඉපැයීම් පරිමාව වැඩි විය යුතුයි. ආධික්‍යය නිතිපතා ප්‍රතිශොධනය කළහොත් විනා පවරා දෙනු ලබන විදේශ විනිමය සඳහා ආධික්‍යයන් ඉදිරිපත් කිරීමෙන් දේශ සංචාරක ඉපැයීම් කළුකඩයට යොමුවීම අවම තත්වයට ගෙන ඒම සම්බන්ධ යෙන් බාධකයන් ඇති බැව් පිළිගත යුතු ය. විදේශීය ගෙවීම් කෙරෙහි දැඩි පාලනයක් පවත්නා තෙක්, විශේෂයෙන්ම, අදිසි ගෙවීම් කෙරෙහි එවැනි පාලනයක් පවත්නා තෙක්, දේශ සංචාරක-යන් විසින් ගෙන එන විදේශීය විනිමය සඳහා වූ ඉල්ලුමට දැඩි තරඟකාරිත්වයන් ඇති කළු කඩ විනිමය අනුපාතිකයේ ස්වරූපයෙන් එළි දැකීම යටකී තත්වයට හේතු විය;

විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී අදිසි ඉපැයීම් සැලකිය යුතු ප්‍රමාණයකට නිල විනිමය අනුපාතිකය ඉක්මවා ආධික්‍යයක් පිරිනැමිනි. මෙය ලංකාවට අදිසි ඉපැයීම් ගලා ඒම වැඩි කරවන පියවරක් විය. ලබාගත හැකි වූ තාවකාලික සංඛ්‍යා තොර තුරුවලට අනුව, අදිසි ඉපැයීම්හි ඇතැම් ශීර්ෂයන් නව දිරි ගැන්වීම්වලට ප්‍රතිමුඛව ඉතා යහපත් පරිදි ක්‍රියාකර ඇති අතර, අනෙක් ශීර්ෂයන්හි ප්‍රති ක්‍රියාව මෙතාක් ඉතා සුළු බව නිරීක්ෂණය කර තිබේ. මෙ අනුව, අදිසි ඉපැයීම්වල මෙතාක් නිරීක්ෂිත දියුණුව, මුළු විදේශීය විනිමය එකතුව කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කර නොමැත. එහෙත්, මෙබඳු ක්‍රමයක සම්පූර්ණ ප්‍රතිඵල දැකීමට සැලකිය යුතු කාලයක් ගත වනු ඇත. අදිසි ඉපැයීම් කෙරෙහි ඇති ක්‍රියා කාරිත්වය ඉදිරි වර්ෂ වල දී වඩාත් සතුටුදයක වනු ඇත.

## ප්‍රාග්ධන ගිණුම්

### (අ) දිගුකාලීන ප්‍රාග්ධනය

ප්‍රාග්ධන ගිණුමෙහි සඳහන් ප්‍රමාණය 1968 දී විදේශීය සම්පත් ගලා ඒම සැලැස්වීම සඳහා දරා ඇති සඵල ප්‍රයත්නය පිළිබිඹු වෙයි. ලංකාවේ ආනයන ධාරිතාව පුළුල් කිරීමෙන්, ලංකා-වේ ආර්ථික වර්ධනයේ වේගය, ගෙවීම් ශේෂය විසින් ඇති කෙරෙන බලපෑම, විදේශීය සම්පත් මාර්ගයන් ගෙන් ලිහිල් කෙරෙයි. 1968 දී ගලා ආ දිගුකාලීන ප්‍රාග්ධන සංඛ්‍යාව රුපියල් දශ ලක්ෂ 224. 8ක් විය. මෙය 1967 තේ ශුද්ධ සංඛ්‍යාව වන රුපි. දශ ලක්ෂ 160.9 ට වඩා සියයට යට 39ක වැඩිවීමක් පිළිබිඹු කරයි. මෙම වැඩිවීමට හේතු වූයේ 1967 රුපියල් දශ ලක්ෂ 201.8 ක් හා රුපි. දශ ලක්ෂ 33.5 ක් වූ ද, 1968 දී රුපියල් දශ ලක්ෂ 272.8 ක් හා රුපියල් දශ ලක්ෂ 40.2 ක් වූ ද්‍රව්‍යාධාර හා යෝජනා ක්‍රම ආධාර විශාල ප්‍රමාණයකින් යොදවා ගනු ලැබීමය. ආධාර මගින් මුදල් යොදවනු ලැබූ පොහොර සහ පිටි ආනයනයන්හි වැඩිවීම් වාර්තාගත විය. සහල්වල මි. ර ගැ. මිල ටොන් එක පවුම් 48 සිට ටොන් එක පවුම් 70 දක්වා අති සීඝ්‍රව ඉහළ නැඟීම නිසා ඇති වූ දුෂ්කරතාවයන් ලිහිල්කර ගැනීමට පිටි ආනයනයන් ගේ වැඩිවීම රුකුලක් විය. මේ අතර පොහොර ආනයනයන් ගේ වැඩි වීම දේශීය ආහාර නිෂ්පාදනය පන ගැන්වීමෙහිලා, ලංකාවට ආධාර විය. ද්‍රව්‍යාධාර ශේෂය, ප්‍රාග්ධන භාණ්ඩ උදා : වශයෙන් යන්ත්‍ර සහ ගමනාගමන උපකරණ සඳහා මුදල් යෙදවීම පිණිස බොහෝ දුරට යොදවා ගන්නා ලදී. 1967 සහ 1968 අතර තුර දී ආධාර ගෙවීම් වැඩි වූයේ හුදෙක් අව-ප්‍රමාණ කිරීම හේතු කොට ගෙන කිසියම් භාණ්ඩ ප්‍රමාණයක රුපියල් වටිනාකම ඉහළ යාම නිසා නොවන බව දැක්විය හැකිය. උදහරණයක් වශයෙන් එ. ජ. ඩොලර් අගය අනුව ගත් කල ද්‍රව්‍යාධාර සහ යෝජනා ක්‍රම ආධාර මගින් ලැබුන ආධාර 1967 දී පැවැති එ. ජ. ඩොලර් 49.4 සංඛ්‍යාවේ සිට 1968 දී. එ. ජ. ඩොලර් 52.6 දක්වා වැඩි වී තිබේ.

1968 අවසානය වන විට, ද්‍රව්‍යාධාර වැඩ පිළිවෙලවල් සතර යටතේ ලැබී ඇති භාණ්ඩයන් ගේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 607.7 ක් විය. මෙකී ණය මුදල් බොහෝ සෙයින් ම ප්‍රාග්ධන භාණ්ඩ හෝ අමු ද්‍රව්‍ය ලබා ගැනීමට හෝ අත්‍යාවශ්‍ය ආහාර හිඟයන් ගෙන් සහනයක් ලැබීමට හෝ 1968 දී පිටි ආනයනය සඳහා යොද ගන්නාක් පරිදි, යොද ගන්නා ලදී. 1968 දී ලැබුණ ද්‍රව්‍යාධාර ( ප්‍රධානයන් ඇතුළුව ) රුපියල් දශ ලක්ෂ 272.4 ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 45.8 ක් ) වූ අතර, ඉන් රුපි. දශ ලක්ෂ 255.0 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 42.9 ක් ) ණය මුදල්වූ අතර, රුපි. දශ ලක්ෂ 17.4 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 2.9 ක් ) ප්‍රදනයන් විය. ත්‍යාගදයක රටවලින්

මිලට ගැනීම් සඳහා බැඳීමකට මෙකී ණය යටත් වෙයි. 1968 දී ලැබුණු ද්‍රව්‍යාධාරවලින් රුපි. දශ ලක්ෂ 55.8 ක් එක්සත් රාජධානියෙන් ද රුපි. දශ ලක්ෂ 122.8 ක් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ද, රුපි. දශ ලක්ෂ 25.3 ක් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවෙන් ද, රුපි. දශ ලක්ෂ 14.0 ක් ප්‍රංශයෙන් ද, රුපි. දශ ලක්ෂ 28.7 ක් ජපානයෙන් ද, රුපි. දශ ලක්ෂ 6.4 ක් ඉන්දියාවෙන් ද, රුපි. දශ ලක්ෂ 2.0 ක් කැනඩාවෙන් ද වීය.

1968 දී ලැබුණු යෝජනා ක්‍රම ආධාර රුපි. දශ ලක්ෂ 40.2 කට ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 6.8 කට ) ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සංඛ්‍යාවනට 1967 තේ සංඛ්‍යාව රුපි. දශ ලක්ෂ 33.5 කින් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 7.0 කින් ) ඉක්මවා වැඩි වී ඇති බැව් පිළිබිඹු වෙයි. 1968 දී ලැබුණු යෝජනා ක්‍රම ආධාරවලින් විශාල කොටසක් උපයෝගීකර ගන්නා ලද්දේ කාර්මික ආයෝජනය සඳහා මුදල් යෙදවීම පිණිසයි. එහෙත් 1967 දී මෙම ආධාර බොහෝසෙයින් ම උපයෝගී කොට ගන්නා ලද්දේ පදනම් ව්‍යුහය සඳහා මුදල් යෙදවීම පිණිසයි. 1968 දී මුදල් යොදවන ලද ප්‍රධාන යෝජනා ක්‍රමයන් වූයේ තුල්හිරිය රෙදි මෝල. ( රුපි. දශ ලක්ෂ 15.2) මස්කෙළි ඔය යෝජනා ක්‍රමය( රුපි. දශ ලක්ෂ 5.4,) ලෝහ භාණ්ඩ සහ කුඩා කර්මාන්ත ( රුපි. දශ ලක්ෂ 2.1 )වාලච්චේනෙයි කඩදාසි බෝඩ් කම්හල,වාත්තු යකඩ කම්හල, වරාය සංවර්ධනය සහ සිමෙන්ති කර්මාන්තයන් ( රුපි. දශ ලක්ෂ 7.1 ), ධීවර සංස්ථාව, ට්‍රොලර් යාත්‍රා යනාදිය ( රුපි. දශ ලක්ෂ 1.2 ) සහ වානේ, ටයර් සහ කොහු කම්හල් ය. ( රුපි. දශ ලක්ෂ 1.4 ) පදනම් ව්‍යුහය කෙරෙන් බැහැර කොට ඉක්මනින් නිමැවුම වැඩිවීම පිළිබඳ බලාපොරොත්තු තැබිය හැකි වඩාත් ඍජුව ඵල ලැබිය හැකි ආයෝජනයන් දෙසට යෝජනා ක්‍රම ආධාර වෙන් කිරීම යොමු කොට තිබේ.

1967 දීට වඩා 1968 දී ණය ආපසු ගෙවීම් ප්‍රමාණය වැඩි වී තිබේ. 1968 දී යෝජනා ක්‍රම ණය වෙනුවෙන් වූ ආපසු ගෙවීම් රුපි. දශ ලක්ෂ 59.0 ක් ( එ. ජ.ඩොලර් දශ ලක්ෂ 9.9 ක් ) වීය. මෙය 1967 දී රුපි. දශ ලක්ෂ 44.4 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 9.3 ක් ) වීය. ද්‍රව්‍යාධාරණය වෙනුවෙන් වූ ආපසු ගෙවීම් රුපි. දශ ලක්ෂ 7.3 ක් ( එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1.2 ක් ) වීය.

පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම සම්බන්ධයෙන් ගලා එන ඍජු ආයෝජන 1967 දී පැවති රුපි. දශ ලක්ෂ 8.4 සිට රුපි. දශ ලක්ෂ 6.8 දක්වා පහත වැටුනේ, නේවාසිකයන් නොවන අය විසින් පාලනය කරන තේ සමාගම් සඳහා ගලා ආ අරමුදල් සුළු වූ බැවිනි.

මේ අනුව, 1968 දී රුපි. දශ ලක්ෂ 236.2 ක දිගු කාලීන නිල ප්‍රාග්ධන ශුද්ධ ගලා ඒමක් ඇති වූ අතර, 1966යේ ශුද්ධ ගලාඒම රුපි. දශ ලක්ෂ 224.4 ක්( එ.ජ.ඩොලර් දශ ලක්ෂ 37.7 ක්) වන පරිදි යටකී දිගු කාලීන ප්‍රාග්ධන ගලාඊම රුපි. දශ ලක්ෂ 11.8 ක පෞද්ගලික දිගු කාලීන ප්‍රාග්ධන ගලා යෑමක් මගින් තරමක් දුරට කැපී ගියේ ය. 1967 දී දිගු කාලීන ප්‍රාග්ධන ගිණුම කෙරෙහි වූ ශුද්ධ ප්‍රාග්ධන ගලාඊම්, රුපි. දශ ලක්ෂ 160.9 ක් (එ. ජ. ඩොලර් දශ ලක්ෂ 33.8 ) ක් වීය. මේ අනුව 1967 විනිමය අනුපාතිකයේ වෙනස්වීම් පිළිබඳ ගැලපීම්වලට ඉඩ හල ද 1967 හා සසඳන කල 1968 දී දිගු කාලීන ප්‍රාග්ධන ගිණුමෙහි වැඩිවීමක් දක්නට ලැබිණි.

## 6. මූල්‍ය චලන

1967 සහ 1968 යන වර්ෂයන් දෙකෙහි අවසානයේදී පැවති ලංකාවේ විදේශීය නිල වගකීම සහ 1968 වර්ෂය තුළදී ඒවායේ ශුද්ධ වෙනස් වීම්, II (ඊ) 6 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. වර්ෂය තුළදී ගෙවුම් පරිමාව පවත්වා ගෙන යෑමට මෙන්ම, 1968 මැයි මාසයේදී විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය අරඹනු ලැබූ අවස්ථාවේදී ඒ සඳහා අතිරේක ආධාරයක් සලසමින් ද, ජාත්‍යන්තර මූල්‍ය අරමු ලින් ලබාගත් ණය මුදලින් වැදගත් කාර්යයක් ඉටු වීය. දළ වශයෙන් බලන කල, ලබා ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 213.2 (එ. ජ. ඩොලර් දශ ලක්ෂ 35.8) ක් වූ අතර, නැවත මිලට ගැනීම් රුපියල් දශ ලක්ෂ 47.7 (එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 8.0) ක් වූයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවිය යුතු ප්‍රමාණයේ ශුද්ධ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 165.5 (එ. ජ. ඩොලර් 27.8) ක් විය. වර්ෂයේ ප්‍රථම ලබා ගැනීම සිදු කැරුනේ අප්‍රේල් මස 27 වැනි දිනදීය. අපනයන ඉපැයුම් උච්චාවචනය හේතු කොට ගෙන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වන්දි පියවීමේ මූල්‍ය පහසුකම් ක්‍රමය යටතේ, දෙවැනි ලබා ගැනීම වශයෙන් රුපියල් දශ ලක්ෂ 114.9 (එ. ජ. ඩොලර් දශ ලත්ෂ 19.37) ක මුදලක් ණයට ගන්නා ලදී. ආනයන ලිහිල් කිරීමේ ක්‍රමය, ක්‍රියාත්මක කළ ඉක්බිතිව, සම්පස්ථ ගිවිසුමේ තුන්වැනි කොටස් මුදල වශයෙන් මැයි මස 15 වැනි දින, රුපියල් දශ ලක්ෂ 62.5(එ. ජ. ඩොලර් දශලක්ෂ 10.5) ක තවත් මුදලක් ලබාගන්නා ලදී. ඒකක් රුපියල් දශ ලක්ෂ 17.9 (එක්සත් ජනපද ඩොලර් 3.0) ක් බැගින් වූ මෙකී සම්පස්ථ පහසුකම යටතේ දෙවැනි සහ තුන් වැනි කොටස් මුදල්

1968 ඔක්තෝබර් මස 10 වැනි දිනදී සහ දෙසැම්බර් 20 වැනි දිනදී ලබා ගන්නා ලදී. වර්ෂය තුළදී සිදු කැරුනු නැවත මිලට ගැනිම් අත්හළ කල බේරුම් කළ යුතු මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 541.6 (එ. ජ. ඩොලර් දශලක්ෂ 91.0) කි. 1968 දෙසැම්බර් අවසානය වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සතුව පැවැති ලංකා රුපියල් ප්‍රමාණය ලංකා සලාකයෙන් සියයට 167.8 ක් විය.

ද්විපාර්ශ්වීය ගෙවීම් ගිවිසුම යටතේ පැවැති ලංකාවේ ණයගැති බව 1967 අවසානයේදී පැවැති රුපියල් දශලක්ෂ 110.4 සිට රුපියල් දශ ලක්ෂ 41.8 කින් වැඩි වී 1968 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 152.2 ක් විය. විශාල වෙනස්කම් ඇති වූයේ චීන සහ සෝ. ස. ස. ගිණුම්වලය. චීනයට අය විය යුතු ශේෂයන්හි රුපියල් දශ ලක්ෂ 64.3ක වැඩිවීමක්. ඇතිවූ මුත්, සෝ. ස. සංගමයට අය විය යුතු ශේෂයන්හි අඩුවීමක් ඇතිවූයෙන් එය තරමක් දුරට (රුපියල් දශලක්ෂ 22.2 ක) කැපී ගියේය. 1967 දී රුපියල් දශ ලක්ෂ 69.9 ක් වූ ආනයනයන් 1968 දී රුපියල් දශලක්ෂ 263.3 දක්වා වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් චීනය සම්බන්ධ වගකීම් වැඩි විය. 1967 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 121.2 ක් වූ සහල් ආනයන සහ රුපියල් දශලක්ෂ 24.6 ක්වූ රෙදිපිළි ආනයන සමග සසඳන කල්හි, 1968 දී සහල් ආනයනය සඳහා රුපියල් දශලක්ෂ 191.4 ක් සහ රෙදිපිළි ආනයනය සඳහා රුපියල් දශලක්ෂ 44.5 ක් ද විය. චීනය වෙත වූ අපනයනයන් 1967 වර්ෂයේ පැවති මට්ටමේ පමණම පැවැතියේය. සෝ. ස. ස. සංගමය සඳහා වන වගකීම් ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 22.1 කින් වෙනස් වූයේ බොහෝ කොටම 1968 අප්‍රේල් මාසයේදී රුපියල් දශ ලක්ෂ 28.6කින් පිළියෙදුම් ණය, පියවීමෙන් ඇතිවූ ප්‍රතිඵලයකි.

7. විදේශීය සංචිත

ලංකාව සතු දළ විදේශීය වත්කම් 1967 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 448.9ක්ව පැවැති අතර 1968 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 463.0 දක්වා වැඩි විය. රන් පවුම් නිදන් අරමුදලෙහි ශේෂයන් 1967 අවසානයේ දී රුපියල් දශලක්ෂ 41.9 ක්වූ අතර 1968 අවසාන යේදී රුපියල් දශලක්ෂ 45.6 දක්වා වැඩි විය. මේ අනුව, රන් පවුම් ණය සහ නින්ද අරමුදල් හැර, ශුද්ධ විදේශීය වත්කම් 1968 අවසානයේදී රුපියල් දශලක්ෂ 417.4 ක්ව පැවැතියේය. මහ බැංකුවෙහි ජාත්‍යන්තර සංචිතය රුපියල් දශලක්ෂ 235.5 ක් විය. 1968 අවසානයේදී රජයේ සහ රජයේ නියෝජ්‍යත්වයන්හි සහ ආයතනයන්හි මුළු සංචිත ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 70.2 ක්වූ අතර, වෙළෙඳ බැංකු සතු විදේශ ශේෂ 1968 අවසානයේ රුපියල් දශලක්ෂ 157.3 ක් විය.

රුපියල් දශලක්ෂ 122 ක මූලික හිඟයක් තිබියදීත් ලංකාව සතු විදේශීය සංචිත වැඩි වූයේ, හුදෙක්ම වර්ෂය තුළදී ලංකාවට උපයෝගී කර ගත හැකිවූ විවිධාකාර ණය ගැනීමේ වැඩ පිළිවෙළවල් නිසාය. නිදසුනක් වශයෙන්, ඉහත යම් තැනක දැනටමත් සඳහන් කොට ඇති පරිදි, 1968 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගත් ශුද්ධ ණය මුදල රුපියල් දශ ලක්ෂ 165.5ක් විය.

ලංකාවේ විදේශීය සංචිතයන් පවත්නා පහත් මට්ටම හේතු කොට ගෙන මෑත වර්ෂයන්හිදී එක්තරා බියක් හට ගෙන ඇත. ගෙවීම් සිදු කිරීමේදී සාමාන්‍යයෙන් ඇතිවන කලින් ගෙවීම් සහ පමාවීම්වලට අමතරව, වැඩ වර්ජන යනාදිය වැනි හදිසි අවස්ථාවන් නිසා උද්ගත වන ආරවුල් නිසා ලංකාව සතු විදේශීය වත්කම් පරිපාලනය ඉතා සියුම් කාර්යයක් විය. මෙකී දුෂ්කරතාවයන් නිසා විදේශීය රටවල බැංකු බොහොමයක් සමගම මහ බැංකුව විදේශීය ණය පහසුකම් ලබා ගැනීම සඳහා සාකච්ඡා කොට තිබේ. එක්සත් රාජධානියේ බැංකු වලින් ලබා ගත හැකි ණය පහසුකම් දළ වශයෙන් රුපියල් දශලක්ෂ 183 ක් වූ අතර, එක්සත් ජන පදයෙහි බැංකු වලින් ලබා ගත හැකි ප්‍රමාණය රුපියල් දශලක්ෂ 89කි. රුපියල් දශ ලක්ෂ 24 ක් පමණ වන තෙක් ණය මාලාවක් මහ බැංකුවට ලබා දීමට ඉන්දීය බැංකු එකඟ වී තිබේ. තවද, එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවිය හැකි බිල්පත්, සීමා රහිතව කෙටි කාලීන පදනමක් මත බේරුම් කිරීමට ද එක්සත් ජනපදයේ ඇතැම් බැංකු විසින් එකඟ වී තිබේ.

විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය

1968 මැයි මස 6 වෙනි දින රජය විසින් විදේශීය විනිමය සහතික පත්‍ර ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. ඇතැම් භාණ්ඩ හා සේවාවන් වෙනුවෙන් සහ ඇතැම් අන්තර් ප්‍රේෂණ මගින් ලද විදේශීය විනිමය, වෙළෙඳ බැංකු වෙත පවරන්නවුනට, මෙම ක්‍රමයේ විධිවිධාන යටතේ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර නිකුත් කරනු ඇත. තේ, රබර්, පොල් තෙල්, කපාපු

පොල්, කොප්පරා සහ ගෙඩි පොල් අපනයනයෙන් ලබන විදේශීය විනිමය මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසු නොවනු ඇත. ඇතැම් ආනයන ශීර්ෂයන් සඳහා වෙනත් නියමිත ප්‍රේෂණයන් සඳහාත් ගෙවීම පිණිස විදේශීය විනිමය අවශ්‍යතාවයනට යටත්ව මතුපිට වටිනාකමට සමානව සහතික පත් පවරා දීමෙන් පසුව විදේශීය විනිමය විකුණුම් අනුපාතිකයනට අනුව වෙළෙඳ බැංකු වලින් විදේශීය විනිමය මිලට ගැනීමට සහතික පත් දරන්නන්ට හිමිකම් තිබේ.

වෙළෙඳ ආනයනයන් ගණයන් දෙකටම, එනම්, (අ) සහ (ආ) ගණයන්ට වර්ග කොට තිබේ. (අ) ගණයේ ආනයනයන් සඳහා වූ සියළුම ගෙවීම් නිල අනුපාතිකයක් අනුව සිදු කැරුනු අතර, විදේශීය විනිමය අයවැය ලේඛනයේ සලාක වෙන් කිරීමකට යටත්වූ ද, එහෙත් සහතික පත් පවරා දීමට අවශ්‍ය වූ ද ගණයක් හා ණයවර ලිපිය ඇරඹූ අවස්ථාවේ දී එහි සම්පූර්ණ වටිනාකමට සහතික පත් පවරා දීමට අවශ්‍ය වන්නා වූ විවෘත සාමාන්‍ය බලපත්‍ර ගණයක් යනුවෙන් (ආ) ගණය නැවත උප ගණවලට බෙදන ලදී. මේ සමගම, වෙළෙඳ ආනයනයන් සඳහා කලින් අය කැරුන බලපත්‍ර ගාස්තු අහෝසි කරන ලදී. 'අ' ගණය තුළට වැටෙන ආධාර ආනයනයන් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් කරන ලදී. එහෙත් 'ආ' ගණයට ගැනෙන ආධාර ආනයනයන් සියයට 20 ක ආනයන බලපත්‍ර ගාස්තුවකට යටත් කරනු ලැබීය. එසේ නුමුදු එවැනි ආනයනයන් සඳහා විදේශීය විනිමය හිමිකම් සහතික පත් පවරා දීමක් අනවශ්‍ය විය. විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයන තීරු බදු ව්‍යුහයේ ඇතැම් ප්‍රතිතෝලන වෙනස් කම් ද සිදු කැරිණ. විශේෂයෙන් නිදහස් කරන ලද ඇතැම් වර්ග වල ආනයනයන් හැර අනෙකුත් සියළුම ගෙවීම් සම්බන්ධයෙන් සම වටිනාකමේ සහතික පවරා දීම අවශ්‍ය විය.

මෙම ක්‍රමයේ සම්පූර්ණ විස්තර, රජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති ප්‍රකාරව 1 පරිශිෂ්ඨයේ (ආ) කොටසේ දක්වේ.

විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමයේ තාර්තිකත්වය පිළිබඳව ගෙවුම් ශේෂය පිළිබඳ වාර්තාවේ ආරම්භ කොටසෙහි ලුහුඩින් සාකච්ඡා කොට තිබේ. රටේ විදේශීය විනිමය ගනුදෙනු දැඩි ලෙසින් පාලනය කිරීමත්, විදේශීය විනිමය ඉපැයීම් පරිමාව නො කඩවාම පහත වැටීමත් හේතුකොට ගෙන, පවත්නා ධාරිතාව උපරිම ප්‍රමාණයටම උප-යෝගී කර ගැනීමට කර්මාන්ත සහ වෙනත් ඵලදයී ආර්ථික ක්‍රියාකාරිත්වයනට ඇති හැකියාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීමේ ප්‍රතිඵල අවබෝධ වීම මෙම ක්‍රමය ඇති වීමට හේතු වූ බව සැකෙවින් දැක්විය හැකිය. ආනයනය කරන ලද යෙදවුම්, විශේෂයෙන්ම කාර්මික හා කෘෂි-කාර්මික අමුද්‍රව්‍ය සහ ආයෝජන භාණ්ඩ, විදේශීය විනිමය නියම දුර්ලභ වටිනාකමට දළ වශ-යෙන් ආසන්න වූ මිලකට ලිහිල් කිරීමත් හේතුකොට ගෙන ආර්ථිකයේ වඩාත් කාර්යක්ෂම හා වඩාත් ප්‍රබල කර්මාන්තයන්හි නිමැවුමේ වැඩිවීමක් ඇතිකර වීමට උපකාරී වනු ඇතැයි හැඟී ගියේය.

සුළු අපනයන නිෂ්පාදිතයන්, විශේෂයෙන්ම අපනයන වෙළෙඳ පොල වල ප්‍රමාණවත් තරඟකාරිත්වයක් ඇති කාර්මික නිෂ්පාදිතයන් තුබූ මුත්, එම කාලසීමාවේ දී පැවැති දැඩි සලාක ක්‍රමය යටතේ ඒවා සඳහා ලැබුණු කාර්මික අමු ද්‍රව්‍ය ප්‍රමාණය සුළු වූ හෙයින් අපනයනය කිරීමේ හැකියාවට අවහිර ඇති වූ බව හැඟී ගියේය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන අංශයට ඉකුත් කාලසීමාවේ දී ඇතැම් විට වාසිදයක විනිමය මිල ගණන් උඩ, අපනයනය කිරීම අතිශයින් ම දුෂ්කර විය. මෙම සාධකය හේතුකොට ගෙන මෙකී කර්මාන්තයන්හි ආයෝජනයන් වැඩි කිරීම සඳහා වූ රුචිය අඩු විණි. නැතහොත් සීමා විණි. සුළු කෘෂිකාර්මික නිෂ්පාදන අංශයේ බණ්ඩයන් බොහොමයක්ම සංවිධානය වී තුබුනේ සංයුක්ත නොවන පදනමක් උඩ හෙයින්, විදේශීය විනිමය ඉපැයීම් හා බැඳී තිබූ ඉහල ආධිපත්‍යයෙන් මෙම අංශය ලබන ආදයම සමාජයීය වශයෙන් වඩාත් හිතකර අන්දමේ ආදයම් ව්‍යාප්තියකට යොමුකර වන බවද හැඟී ගියේය. එමෙන්ම, විශාල ප්‍රමාණයක ලාංකික ව්‍යවසායකත්වයෙන් යුතු වූ මෑත වර්ෂවලදී ආරම්භ කැරුණු ආනයන ආදේශක කර්මාන්තයන්හි ක්‍රියාකාරිත්වය ප්‍රසාරණය වීමෙන්, වලකනු ලැබීය. ඉහත නිෂ්පාදන හෝ ඉහත ආනයනයන් මත පදනම් වූ විදේශීය විනිමය වෙන් කිරීම්, බොහෝ දුරට පදනම් කරගත් දැඩි පාලන ක්‍රමය මගින් පවත්නා ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ප්‍රමාණයකින් සීමා කරනු ලැබීය. අත්‍යාවශ්‍ය යෙදවුම් බහුල වශයෙන් ලබා ගැනීමට එවැනි ව්‍යාපාරික ආයතන වලට අවස්ථාව සලසන ක්‍රමයක් මගින් ඔවුනට නිමැවුම් තීව්‍ර කරලීමට හැකියාවක් ලබාදෙන බවත්, එහි ප්‍රතිඵලය සේවා නියුක්-තිය හා ආදයම කෙරෙහි බලපාන බවත්, පෙනී ගියෙන් වෙනත් කරුණු සම්බන්ධයෙන්

විදේශීය විනිමය මිලත් සමග නියම මිල අනුක්‍රමිකව එකෙලි කිරීමෙන්, ආනයන ආදේශකයන්ගේ, විශේෂයෙන්ම, පවත්නා නිල විනිමය අනුපාතිකයට අනුව, නිෂ්ඵල විය හැකි අමු ද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩයන්ගේ දේශීය නිෂ්පාදනය තිව්‍ර විය හැකි යැයි විශ්වාස කිරීමට කරුණු තිබිණි.

පවත්නා විනිමය අනුපාතිකය විදේශීය විනිමයේ නියම දුර්ලභ වටිනාකම හා නොගැලපෙන බැව් පිළිගනු ලැබූ බවත්, මෙහි එක් ප්‍රතිඵලයක් වනුයේ විදේශීය විනිමය කළු කඩයට යොමුවීම බවත් පිළිගන්නා ලදී. කළු කඩය වූ කලී සැලකිය යුතු කාලසීමාවකට ලංකාවේ විදේශීය ගණුදෙනු වල ලක්ෂණයක් පැවැති, දැඩි පාලනයන්ගෙන් ජනිත වූවකි. එම නිසා විදේශීය විනිමය ඉපැයුම් කළු කඩය දෙසට යොමු කරලීම සඳහා දිරි ගැන්වීමක් ඇති විය. මෙය විශේෂයෙන්ම ඇති වූයේ, සංචාරක විනිමය වැනි සේවා ශීර්ෂ කිහිපයක් සම්බන්ධයෙනි. විදේශීය විනිමයෙහි නියම දුර්ලභ මිල ට තරමක් දුරට ආසන්න වශයෙන් අනුරූපී වූ ආධිත්‍යය ප්‍රදානය, විනිමය දූෂණයන්හි ගැලීම සඳහා වූ දිරිගැන්වීම අඩුකරලනු ඇතැයි හැඟී ගියේය.

1968 දී විදේශීය විනිමය හිමිකම් සහතිකපත් ක්‍රමය ක්‍රියාත්මක වී ඇත්තේ මාස අටක් පමණක් හෙයින්, මෙම ක්‍රමය පිළිබඳව අවසාන නිගමනයකට බැස ගැනීමට තරම් ප්‍රමාණවත් කාලයක් ගත වී නැත. එහෙත්, ලංකා ගෙවුම් ශේෂයේ සංයෝග වන උපනතීන් පිළිබඳව හැඳින්වීමෙහි දී, කර ඇති කෙටි හෝ ප්‍රකාශ කර ඇති පරිදි මූල්‍ය, පිස්කල් සහ නිෂ්පාදන අංශයන්හි වෙනත් ක්‍රියා මාර්ගයන් සමග ඇති කර ගත් මෙම ක්‍රමය දිරිගන්වන ප්‍රතිඵල දක්වා ඇති බවට සැලකිය යුතු සාක්ෂි තිබේ.

ඒ ඒ අපනයන හා ආනයන ගණයන් ගේ සංචරණය සහ දේශීය කර්මාන්තයේ විශේෂයෙන්ම, මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුකොට ගෙන අමු ද්‍රව්‍ය, අන්තර් සහ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රමාණයන් වැඩි කර ගත හැකි වූ කර්මාන්තයන්ගේ ක්‍රියාකාරිත්වයේ උපනතිය සවිස්තරව විශ්ලේෂණය කළ කල්හි මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්ව්‍යාජ දියුණුවක් ඇති වී තිබෙන බව පෙනේ. මේ අතර නිමැවුමේ ඇති වූ සීඝ්‍ර වැඩිවීම මිලෙහි ඇති වූ මූලික වැඩිවීම, සමහන් කිරීමෙහි ලා සහාය විය. මේ අනුව නිමැවුමේ ඇති වූ දියුණුව නිසා භාණ්ඩ බොහොමයකම මිල අඩුකර ගැනීමටත්, ආනයන ලිහිල් කිරීම මාර්ගයෙන් නිෂ්පාදන අංශයට ඇතුළත් කෙරුණු තරඟකාරිත්වය නිසාත්, රටෙහි දුර්ලභ විනිමය සම්පත් වල සුවිධානයක් ඇතිවීමට මග පැදින. තවද, ආනයනයන් ලබාගත හැකිවීම මගින් ජනිත වූ විශ්වාසය හේතුකොට ගෙන ආනයන ඇණවුම් ගලා ඒම පහසු කරලීමට ආධාර විය යුතුය. ඉකුත් වසරේ දී බලපත්‍ර නිකුත් කළ වහාම ඇණවුම් කිරීම සඳහා විශාල තදබදයක් ඇති කරවමින් රටේ විදේශීය විනිමය සංචිතය කෙරෙහි මහත් පීඩනයක් ඇතිකළ තත්ත්වය අනුව නිසා බලන කළ මෙකී ආනයන ගලා ඒම පහසු කිරීම හේතු කොට ගෙන ගෙවීම් පොකුරු ගැසීම් අඩුවිණ.

1968 ආනයනයන්හි හා අපනයනයන්හි සමස්ථ අගය පිළිබඳ මතු පිට පරීක්ෂණයකින් එම වසර තුළ දී ඇති වූ වෙනස් කම් පිළිබඳ යථාතත්වය අනාවරණය නොවෙයි. මුළු අපනයන වටිනාකම් 1967 පැවැති එ. ජ. ඩොලර් දශ ලක්ෂ 347 සිට 1968 දී එ. ජ. ඩොලර් දශ ලක්ෂ 332 දක්වා ඇත්ත වශයෙන්ම පහත වැටුණ අතර, එම කාලසීමාවේදී ම ආනයන වටිනාකම එ. ජ. ඩොලර් දශ ලක්ෂ 417 සිට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 393 දක්වා වඩාත් වේගයෙන් පහත වැටුණි. අපනයන හා ආනයන සැකැස්මෙහි ද වැදගත් වෙනස් වීම් ඇති වුණ අතර, මෙම ක්‍රමය අගැයීමෙහිලා සැලකිය යුතු තරම් සතුටුදායක දර්ශනයක් ඉන් සැලසුණි. එහෙත් කලින් සඳහන් කළ පරිදි වඩාත් ඵලදායී බවක් හා කාර්යක්ෂමතාවයක් සහතික කර ගැනීමෙහිලා 1968 දී මුල පිරූ අනෙකුත් සම්බන්ධිත ක්‍රියාමාර්ගයන්ගෙන් ඇති වන වාසි දායක ප්‍රතිඵල නියම වශයෙන් වෙන් කර දැක්විය නොහැක.

1967 සහ 1968 වර්ෂ වලදී නව කාර්මික නිෂ්පාදන ඇතුළු ලංකාවේ සුළු නිෂ්පාදන අපනයන වල පරිමාව හා වටිනාකම පිළිවෙලින් II (උ) 7 සහ II (උ) 8 වැනි සංඛ්‍යා සටහන් වලින් දැක්වේ. 1967 නොවැම්බර් මාසයේ දී සහ 1968 මැයි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද විනිමය ප්‍රතිසංස්කරණ වල ප්‍රතිවිපාක ඇගැයීම පහසු අගැයීම සඳහා වටිනාකම් එක්සත් ජනපද ඩොලර් වලින් දක්වා ඇත. මෙම වර්ෂවලදී අපනයනය කරන ලද ප්‍රාථමික භාණ්ඩ තිහක හා නිෂ්පාදනය කළ භාණ්ඩ 17 ක තොරතුරු සංඛ්‍යා සටහන් වලින් විශ්ලේෂණය වේ.

## 1. වෙළඳ භාණ්ඩ අපනයන

මුළු වශයෙන් බලන කල, මෙම භාණ්ඩ වල එක්සත් ජනපද ඩොලර් වලින් වටිනාකම සැලකිය යුතු ලෙස වැඩි වී නොමැත. එහෙත් ප්‍රාථමික භාණ්ඩල වටිනාකම හා සසඳන විට නිෂ්පාදනය කළ භාණ්ඩවල වටිනාකමෙහි කැපී පෙනෙන වැඩිවීමේ අනුපාතයක් දක්වීනි. මෙම පුළුල් ගණයන් තුළ විවිධ භාණ්ඩ වල පරිමාවෙහි හා වටිනාකමෙහි ප්‍රතිලෝම සංචලනයක් ඇති විය. 1967 හා සැසැඳීමේ දී, සුළු නිෂ්පාදන අපනයන වල මුළු වටිනාකම් වෙත වූ යහපත් ප්‍රතිවිපාක 1968 සිදු වූ මෙම පහළ වැටීම් මගින් සුළු වශයෙන් වෙනස් විය.

නිමැවුමෙහි හා වටිනාකමෙහි වූ වැඩිවීම වැඩිකොට කැපී පෙනුනේ නිෂ්පාදන භාණ්ඩ අංශයේය. වටිනාකමින් වැඩියෙන්ම ප්‍රාසාරණය වූ අංශයන් වූයේ, යකඩ හා වානේ භාණ්ඩ, ඇලුමිනියම් නිෂ්පාදන, බූට් සහ සපත්තු, චොක්ලට් හා කොකෝවා නිෂ්පාදන රෙදිපිළි, බෝ-තල්වල අසුරන ලද පළතුරු, ග්ලිසරින් සහ තේ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ විය. නිෂ්පාදනය කළ භාණ්ඩ අපනයනයෙන් ලංකාවේ ඩොලර් ඉපයීම් වලට එකතු වූ ශුද්ධ ඉපයීම් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1.2 ක් විය. II (උ) 7 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වෙන පරිදි, මෙම භාණ්ඩ වල නිමැවුම් පරිමාවේ ඇති වූ වැඩිවීම් වලින් හෙළිවනුයේ, විදේශීය විනිමය හිමිකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් අමු ද්‍රව්‍ය හා අත්‍යාවශ්‍ය යෙදවුම් වඩා විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වීමෙන් පසු එම කර්මාන්ත වල උපයෝගී කොට නොගෙන තිබි ධාරිතාව වඩා පුළුල් ලෙස උපයෝගී කර ගැනීමය.

ප්‍රාථමික භාණ්ඩ වල ඇතිවන නොවැලැක්විය හැකි ප්‍රශ්නය වන කෙටිකල් සැපයුම් පමා වීම් හේතුකොට ගෙන විනිමය ප්‍රතිසංස්කරණ දෙකින් සැලසුන දිරිගැන්වීම් වලට ප්‍රතිචාරය දක්වීමේ හැකියාවට බාධා විය. නිෂ්පාදනය කළ භාණ්ඩ අපනයන පරිමාවේ වර්ධන අනුපාතිකය හා සැසඳීමේ දී බොහෝ භාණ්ඩ වල අපනයන පරිමාවේ ප්‍රතිශත වැඩිවීම බොහෝ දුරට මදතරම් වූ බැව් මේ අනුව නිරීක්ෂණය කොට ඇත. එසේ වුවද, 1967 සහ 1968 අතර කාලය තුළදී සැලකිය යුතු තරමින් අපනයන වැඩි වී ඇති භාණ්ඩ කිහිපයක් ප්‍රාථමික නිෂ්පාදන අතර විය. මේ අනුව, ගම්මිරිස් ආනයනයන්ගේ වටිනාකම සත් ගුණයකින් ඉහල ගිය අතර, තවත් භාණ්ඩ කිහිපයකම, එනම් කුරුඳුතෙල්, කුරුඳු පොතු, කොකෝ, පුලුන් සහ සාදික්කා පරිමාවන් සියයට 50 සිට සියයට 100 යෙන් ඉහල ප්‍රමාණයක් දක්වා වැඩි විය. කෙසේ වුවද, සමහර භාණ්ඩ සම්බන්ධයෙන්, විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයෙන් ලැබූ අනුබලයන්ගේ බලපෑම්වලින්, දේශගුණය, වගා ක්‍රමයන්ගේ දියුණුව, යහපත් ප්‍රවාහන පහසුකම්, සංවිධාන සහ පරිපාලනය යන සාධක-යන්ගේ බලපෑම් වෙන් කිරීම දුෂ්කර විය. කෙසේ වුවද, 1968 මැයි මස ඇති කළ විනිමය ප්‍රතිසංස්කරණයන් මගින් උද්ගත වූ මිල පිලිබඳ දිරිගැන්වීම් මගින්, සමහර නව ප්‍රාථමික භාණ්ඩ වැඩියෙන් අපනයන කිරීමට අනුබලයක් ලැබුණා යයි පැවති කල්පිතය ස්ථිර කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇත. උදහරණයක් වශයෙන්, 1967 දී ශීත කළ මාලු අපනයනයන් කිසිවක් නොවුවද, 1968 දී මෙම අපනයනයන්ගේ වටිනාකම එක්සත් ජනපද ඩොලර් 76 දහසක් විය. එමෙන්ම, කොකෝ අපනයනයන්ගේ වටිනාකම එ. ජ. ඩොලර් 870 දහසකින් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1.2 දක්වා වැඩි වූ අතර, ඉල්මනයිට් අපනයනයන් එ. ජ. ඩොලර් 319 දහසකින් එ. ජ. ඩොලර් 435 දහස දක්වා ඉහල ගියේය.

1968 දී සුලු අපනයන භාණ්ඩ පිළිබඳ අධෛර්යමත් ලක්ෂණයක් වූයේ, අගනා සහ අගනාකමින් අඩු මැණික් ගල් අපනයනයන් සම්බන්ධයෙනි. පරිමාව අනුව, 1967 දී කැරට් 25 දහසකින් 1968 දී කැරට් 196 දහසක් දක්වා වැඩි වුවද, මෙම ආනයනයන්ගේ වටිනාකම එ. ජ. ඩොලර් 729 දහසකින් එ. ජ. ඩොලර් 341 දහස දක්වා අඩු විය. විවිධ වර්ෂයන් තුළ දී, අපනයනය කරන මැණික් ගල් වල තත්ත්වය වර්ෂයෙන් වර්ෂයට වෙනස් විය හැකි බැවින්, ඒවායේ වටිනාකම, අපනයනය කරන ප්‍රමාණයට අනුව සමානුපාතිකව වෙනස් විය යුතු නැතැයි පිළිගනු ලැබුවද, 1968 දී වටිනාකමෙහි වූ සැලකිය යුතු පහල වැටීමට හේතුව විස්තර කළ නොහැක.

## 2. අදෘෂ්‍ය ඉපයීම් සහ පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඊම

අදෘෂ්‍ය ඉපැයීම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, නොයෙකුත් අනුබලයන් ලැබෙන විනිමය ප්‍රතිසංස්කරණයකින් වැඩිම ප්‍රතිචාරයක් ඇතිවන අංශයන් වනු ඇත්තේ දේශ සංචාරක ඉපයීම්, පෞද්ගලික ප්‍රාග්ධනය සහ වෘත්තීය ඉපැයීම් ද වෙති. අදෘෂ්‍ය ගිණුමෙහි අනෙකුත් අංශයන් වන රක්ෂණ චාරිකා, ඒජන්සි හා ප්‍රධාන කාර්යාල වියදම් ඇතුළු විශ්‍රාම වැටුප් යනාදිය සංකෝචනාත්මක ස්වරූපයෙන් යුතුවන අතර, එබැවින් ඒවා වෙන්

වශයෙන් ගත යුතුය. දේශ සංචාරක ඉපැයීම් සම්බන්ධයෙන් ඇති සාක්ෂි වඩා ධෛර්යමත් සුලුය. II (උ) 6 වැනි සංඛ්‍යා සටහන මගින් 1967 සහ 1968 මැයි සිට දෙසැම්බර් දක්වා කාලජ්ඡේදය තුළ දී දේශ සංචාරක වියදම් දක්වා ඇත. එමගින් පෙනී යන පරිදි 1968 දී එම මාසයන් තුළ දී ඉපැයූ මුදල් ප්‍රමාණය බොහෝ සේ වැඩි වී ඇත.

**සංචාරකයන්ගෙන් ඉපැයීම් — 1967 මැයි—දෙසැම්බර් සහ 1968**

එ. ජ. ඩොලර් දහස් ගණනින්

| | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1967 | 111 | 86 | 86 | 70 | 131 | 81 | 124 | 94 | 783 |
| 1968 | 117 | 82 | 141 | 125 | 113 | 172 | 197 | 280 | 1,227 |
| % වෙනස | 5 | -5 | 64 | 79 | -14 | 112 | 59 | 198 | 57 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම කාලසීමාව තුළදී දේශ සංචාරකයින්ගේ වියදම් හේතු කොට ගෙන වූ ලැබීම් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 0.78 සිට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1.2 දක්වා 1968 දී වැඩිවිණි. වටිනාකම් වශයෙන් බලන කළ මෙය සුළු වැඩිවීමක් වුවද, සාපේක්ෂිත වශයෙන් බලන කල මෙය සැලකිය යුතු ප්‍රමාණයක් වන අතර, 1967 මට්ටම ඉක්මවා සියයට 57 ක වැඩිවීමක් ද පිළිබිඹු කරයි. 1968 මැයි මාසයේ දී විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ඇරඹීමත් සමගම දේශ සංචාරක ඉපැයීම් වලට අධි විනිමය අනුපාතිකයක් සඳහා හිමිකම් ලැබිණි.

අදාල සංඛ්‍යා තොරතුරු පිරික්සා බලන කල්හි, 1968 මැයි — දෙසැම්බර් කාල සීමාව තුළදී ඒක පුද්ගල එ. ජ. ඩොලර් ඉපැයීම් සියයට 25.2 කින් 1967 එම කාල සීමාව ඉක්මවා වැඩි වී ඇති බැව් පෙනී යයි. එමෙන්ම 1968 මැයි — දෙසැම්බර් කාලසීමාව තුළදී ඒක පුද්ගල ඉපැයීම් එ. ජ. ඩොලර් 65.3 ක් වූ අතර, 1967 එම කාලසීමාව තුළදී ලැබී ඇති ඒක පුද්ගල ඉපැයීම් ප්‍රමාණය 52.2 ක් පමණි.

විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයේ ප්‍රතිලාභයන් සඳහා හිමිකම් තුබූ සියළුම පෞද්ගලික ප්‍රාග්ධන සංචලනයන් සම්බන්ධයෙන් 1968 දෙවන භාගයේ දී, 1967 අනුරූප කාල සීමාවට වඩා රුපියල් දශ ලක්ෂ 2.3 ක වැඩිවීමක් දක්නට ලැබුණි. විදේශීය විනිමය අනුව, මෙම වැඩිවීම එ. ජ. ඩොලර් 3,49,515 ක් විය. එහෙත්, පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඊම් වැඩිවීමට, හේතු වූයේ විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමයෙන් සැලසුන දිරිගැන්වීම නිසා යයි දක්වීම දුෂ්කරය. එයට හේතු වූයේ, එවැනි අරමුදල් දූනටමත් අනුමත කළ කාර්මික යෝජනා ක්‍රමයනට යොමු කළ හැකිව තුබූ හෙයිනි. විවිධ භාණ්ඩ ගණයෙහි, එතෙර සේවා නියුක්තියෙන් හා වෘත්තීය සේවාවන් ගෙන් ලද ඉපැයීම්, සහ කොමිස් සහ නියෝජ්‍යත්ව වියදම් නිසා වූ ගලා ඊම් වර්ධනය විය.

මෙය පිඩුකොට දක්වීමේදී විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර සඳහා සුදුසුකම් ලැබූ අදෘෂ්‍ය ඉපැයුම් අතුරින්, සමහර අංශයන් සතුටුදායක ලෙස ප්‍රතිචාරය දක්වා ඇත. මේ අනුව, මෙම අංශයන් වෙනුවෙන් ලද අදෘෂ්‍ය ඉපැයීම් 468 දෙවැනි භාගයේ දී සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. කෙසේ වුවද, අනිකුත් ශීර්ෂයන් සම්බන්ධයෙන් ප්‍රතිචාරය එතරම් යහපත් වූයේ නැත. මෙයට හේතු වන්නට ඇත්තේ මෙම ගණයන්ගේ යැවූ ප්‍රේෂණයන් සකෝචනාත්මක ස්වරූපයක් ගත් අතර, එබැවින් වෙන් වශයෙන් ගත යුතුය.

### 3. වෙළඳ භාණ්ඩ ආනයන

II (උ) 9 වැනි සංඛ්‍යා සටහනින්, 1968 දී, 'අ' වර්ගයේ සලාකය යටතේ ගෙන්වූ ආනයනයන් සහ විවෘත සාමාන්‍ය බලපත්‍රය යටතේ වූ භාණ්ඩ ආනයනයන් වෙනුවෙන් කළ මුලු ගෙවීම් ප්‍රමාණය පිඩුකොට දක්වා ඇත. තාවකාලික සංඛ්‍යා තොරතුරු අනුව, මුළු ගෙවීම් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 184.9 කින් විය. ආර්ථික ගණ වශයෙන් කළ වර්ගීකරණයක් පදනම් කිරීමෙන්, මුළු ප්‍රමාණයෙන් අන්තර් භාණ්ඩ ප්‍රතිශත කොටස 51.1 ක් වූ අතර, ආයෝජන භාණ්ඩ සියයට 26 ක් විය. ආනයනයන්ගේ ප්‍රමුඛ ගණයන් වූයේ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ ( සියයට

25.9) නිෂ්පාදිත භාණ්ඩ (සියයට 41.8) සහ රසායනික ද්‍රව්‍ය (සියයට 11.2) වේ. විවිධ නිෂ්පාදිත භාණ්ඩ සහ ආහාර ආනයනයන්, පිළිවෙලින්, සියයට 5.9 ක් සහ 7.9 ක් විය. ඒ හෙයින් (ආ) ගණය යටතේ ගලා ආ ආනයනයන්ගෙන් සියයට 77 ක් පමණ ප්‍රමාණයක් අන්තර් සහ ආයෝජන භාණ්ඩ වලින් සමන්විත වූ අතර, සියයට 23 ක් පාරිභෝගික භාණ්ඩ වලින් සැදුම්ලත් බැව් පෙනී යයි. සලාකය යටතේ වූ (ආ) ගණයේ ආනයනයන් වෙන් කොට හඳුනා ගැනීමේ තවත් සීමා වීමක් මෙම සංඛ්‍යා තොරතුරු වලින් දක්නට ලැබේ. එකී ආනයනයන් සංඛ්‍යා තොරතුරුවලින් ඉවත් කළ හොත් විවෘත පොදු බලපත්‍ර යටතේ ඇත්ත වශයෙන්ම වූ ආනයන ප්‍රමාණය සංඛ්‍යා තොරතුරුවලින් පෙන්වන ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් අඩු වනු ඇත.

විදේශීය විනිමය හිමිකම් සහතිකපත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු 1968 මැයි–දෙසැම්බර් කාලච්ඡේදය තුළ දී, විවෘත පොදු බලපත්‍ර යටතට පත් කොට ඇති භාණ්ඩ වර්ගයන් සහා විවෘත කරන ලද ණයවර ලිපි වර්ගයක් පිළිබඳ පුළුල් විස්තරයක් II (උ) 10 වැනි සංඛ්‍යා සටහන සපයා ඇත. එවැනි ආනයනයන් වෙනුවෙන් විවෘත කරන ලද ණයවර ලිපිවල මුළු වටිනාකම රුපි. දශ ලක්ෂ 306.2 ( ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 51.4 ) කි. ආර්ථික වර්ගීකරණයට අනුව මුළු ප්‍රමාණයෙන් සියයට 16.6ක් ව පාරිභෝගික භාණ්ඩ සඳහා වූ අතර, අන්තර් සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින්, සියයට 56.2 හා සියයට 27.1 ක් ද වෙයි.

සංඛ්‍යා තොරතුරුවල වැදගත් ලක්ෂණයක් නම්, ඉල්លුමෙහි උච්චතම මට්ටමක් පැවැති ජූලි සහ අගෝස්තු කාලච්ඡේදයෙන් පසුව, විවෘත කරන ලද ණයවර ලිපි සාමාන්‍ය වටිනාකම රුපි. දශ ලක්ෂ 5 ක් වූ අතර, ඉන් අනතුරු කාලච්ඡේදයේ දී ඒවායේ වටිනාකම හීනවී යාමය. 1968 අගෝස්තු මාසයට පසු කාලච්ඡේදය තුළ දී, විවෘත කරනු ලැබූ ණයවර ලිපිවල වටිනාකම මසකට රුපි. දශ ලක්ෂ 30 සිට රුපි. දශ ලක්ෂ 40 අතර උච්ඡාවචනය වීම සිදු විය. මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තින් හි ප්‍රධාන වෙනස්කම් සිදු නොකළහොත්; මෙකී පදනම මත, විවෘත සාමාන්‍ය බලපත්‍ර ආනයනයන් වෙනුවෙන් ණයවර ලිපි සඳහා වූ වාර්ෂික ඉල්ලුම වර්ෂයකට රුපි. දශ ලක්ෂ 5000 කට වඩා වැඩි නොවනු ඇත. 1968 වර්ෂය සඳහා වූ භාණ්ඩ තොරතුරු අනුව මෙම ප්‍රමාණයේ වෙළෙඳ භාණ්ඩ ආනයනයන් ගේ වටිනාකමෙන් සියයට 21 කට ආසන්න වනු ඇත.

1968 මැයි–දෙසැම්බර් කාලච්ඡේදයෙහි, විවෘත සාමාන්‍ය බලපත්‍ර ආනයනයන් සඳහා විවෘත කරනු ලැබූ ණයවර ලිපිවල නියම වටිනාකම, එම වර්ෂයේ දී ලංකාවේ මුළු වෙළෙඳ භාණ්ඩ ආනයනයන් ගෙන් සියයට 13 ක් විය. එතැන් පටන් විවෘත සාමාන්‍ය බලපත්‍ර වර්ගයේ ආනයනයන් ගෙන් විශාල ප්‍රමාණයක් අත්‍යාවශ්‍ය අතර මැදි සහ ආයෝජන භාණ්ඩයන් සහ සාමාන්‍ය තරමේ පරිමාවන් සානුබලයෙන් ලබා දෙන භාණ්ඩයන් ගෙන් සමන්විත වේ. එවැනි භාණ්ඩයන් ඒවායේ සැබෑ හිඟකමට ආසන්න මිලකට ලබා ගත හැකිවීම වැදගත් මූල්‍ය සහ ආර්ථික ප්‍රතිවිපාක දනවයි. පළමු වශයෙන්, අතීතයේ දී සලාක ප්‍රමාණයන් ලැබීමේ වරප්‍රසාදයන් භුක්ති විඳි ආනයනයකයන් විසින් හිඟකම නිසා ලැබූ ලාභයන් මෙමගින් උරාගනු ඇත. දෙවනුව මෙවැනි ආනයනයන් ගෙන්වනු ඇත්තේ මෙම යෙදවුම් යොදා ගන්නා ව්‍යාපාරයන් ප්‍රයෝජනවත් සහ ලාභදායක වී නම් පමණි. අවසාන වශයෙන් සීමාවක් හා පරීක්ෂාවක් නොමැතිව ආනයනයන් ලබා ගත හැකිවීම, විදේශ විනිමය පිරිනැමීමට ඒවා ප්‍රයෝජනයට ගන්නන් ධෛර්යමත් කරනු ඇත්තේ ආනයන සහ විනිමය පාලන දඩි කිරීමක් අපේක්ෂාවෙන් භාණ්ඩ රැස් කරනු වෙනුවට බාධා රහිතව ආනයනයන් ගලා ඒම කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීම නිසා ය. විකල්ප සැපයුම් මාර්ගයන් හී තරඟකාරී බව පරීක්ෂා කිරීමට වැඩි කාලයක් ලැබෙන විට, ඉතාමත් අඩු මිලක් ඇති ස්ථානයන් ගෙන් මිලදී ගැනීමටද ඔවුන්ට ධෛර්යයක් ලැබෙනු ඇත.

ආනයන සඳහා වන ඉල්ලුමෙහි අඩුවීමක් කෙරෙහි විදේශ විනිමය සහතික පත් ක්‍රමය සහ එහි ප්‍රතිවිපාකයක් වශයෙන් ලංකා රුපියල අනුව විදේශ විනිමයෙහි මිල ඉහළ යාමෙන් ආනයන ඉල්ලුම අඩු වූයේ දැයි මෙපමණ සුළු කලකින් කිව නොහැකිය. මෙම වැඩ පිළිවෙල 1968 දී ක්‍රියාත්මක වී ඇත්තේ මාස අටක් පමණක් වන අතර සහ විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ වන ආනයනයන් මුල් වර්ෂයෙහි ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගෙවුම්වලින් සියයට 13 කට වඩා වැඩි වී නැත. තවද, එය පවතින වෙළෙඳ මිල අනුව 1968 දී ලංකාවේ දළ දේශීය වියදම්වලින් සියයට 2.9 ක් පමණක් වේ. තවද, ආනයන වටිනාකම, විවිධ මාසයන් අතර, සාපේක්ෂක වශයෙන් ස්ථාවර ව පැවැති අතර, වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්වා නැත.

# සංඛ්‍යා සටහන II (උ) 1 (අ)

## ලංකාවේ ගෙවුම් ශේෂය

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | (1) අපනයන (මුළු) | (2) ආනයන (මුළු) | (3) වෙළෙඳ ශේෂය (I) එකතුව | (3) වෙළෙඳ ශේෂය (II) (එයින් වෙළෙඳ ගනුදෙනු) (ආ) | (4) ශුද්ධ අදිසි (භාණ්ඩ වශයෙන් ලැබුණු තෑගි ඇතුළුව) | (5) ශේෂය වර්තන ගිණුම්හි 3 (1) සහ (4) එකතුව (ශුද්ධ) | (5) ශේෂය එයින් වෙළෙඳ ගනුදෙනු සඳහන් වර්තන ගිණුම් ශේෂය | (6) දිගු කාලීන ප්‍රාග්ධන (ඇ) | (7) මූලික ශේෂය (5) සහ (6) එකතුව (ශුද්ධ) | (8) කෙටි කාලීන ප්‍රාග්ධන (ශුද්ධ) (ඈ) | (9) වැරදි හා අත්හැරීම් | (10) විදේශීය වත්කම්හි වෙනස (වැඩිවීම්) + | (11) කාලච්ඡේදය අවසානයේදී මුළු විදේශීය වත්කම් | (12) වත්කම් (රන්පවුම් ණය නිදන් අරමුදල් අත්හැර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 ... | 1,669 | 1,764 | — 95 | — 45 | — 100 | — 195 | — 127 | — 18 | — 213 | — 1 | — | —214 | 1,062 | 973 |
| 1958 ... | 1,624 | 1,713 | — 89 | — 11 | — 64 | — 153 | — 119 | + 8 | — 145 | + 32 | — 16 | —129 | 933 | 838 |
| 1959 ... | 1,773 | 1,958 | — 185 | — 49 | — 23 | — 208 | — 66 | + 32(ඉ) | — 176 | — — | + 1 | —175(ඉ) | 734 | 665 |
| 1960 ... | 1,796 | 2,006 | — 210 | — 127 | — 10 | — 220 | — 63 | + 22 | — 198 | — 24 | + 29 | —193 | 541 | 458 |
| 1961 ... | 1,707 | 1,794 | — 87 | — 5 | — 7 | — 95 | — 48 | + 11 | — 84 | + 93)ඊ) | — 19 | — 9 | 532 | 441 |
| 1962 ... | 1,763 | 1,906 | — 143 | — 47 | + 3 | — 140 | — 81 | + 39 | — 101 | + 42(ඊ) | + 31 | — 28 | 504 | 407 |
| 1963 ... | 1,708 | 1,869 | — 161 | — 27 | — 7 | — 168 | — 78 | + 80 | — 88 | + 42 | + 4 | — 42 | 462 | 369 |
| 1964 ... | 1,767 | 1,960 | — 193 | — 39 | + 33 | — 160 | — 82 | + 69(ඉ) | — 92 | + 33 | — 8 | — 51(ඉ) | 351 | 305 |
| 1965 ... | 1,909 | 1,922 | — 13 | + 128 | + 72 | + 59 | + 136 | + 58(ඉ) | + 117 | + 3(ඊ) | — 6 | +114(ඉ) | 440 | 408 |
| 1966 ... | 1,674 | 2,018 | — 344 | — 119 | + 53 | — 290 | — 132 | + 137 | — 153 | + 53)ඊ) | — 22 | — 122 | 318 | 282 |
| 1967 ... | 1,650 | 1,985 | — 335 | — 85 | + 46 | — 289 | — 85 | + 161 | — 128 | +271(ඊ) | — 12 | + 131 | 449 | 407 |
| 1968(උ) | 1,975 | 2,341 | — 366 | — 29 | + 20 | — 346 | — 51 | + 224 | — 122 | +162(ඊ) | — 26 | + 14 | 463 | 417 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) විදේශීය ගෙවුම් හා ලැබීම් පිළිබඳ විනිමය පාලන සංඛ්‍යා තොරතුරු පදනම් කොට.

(ආ) පහත සඳහන් දෑ ඇතුළත්ය. (1) වෙළෙඳ බැංකුවල විදේශීය විනිමය ගනුදෙනු, (2) වෙළෙඳ බැංකුවෙහි බහිර්වාසික ගිණුම්, (3) මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු, (4) ගෙවුම් ගිවිසුම් ගනුදෙනු සහ (5) විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින සමාගම් (එනම්, රන්පවුම් වැවිලි සමාගම් සහ වෙළෙන්දන් ගේ ගිණුම්)

(ඇ) පෞද්ගලික සහ රජයේ දිගුකාලීන ශුද්ධ සංචලන ඇතුළත්වේ. බැර සංඛ්‍යා මෙසේය. 1957 රුපියල් දශ ලක්ෂ 23; 1968 රුපියල් දශ ලක්ෂ 23; 1959 රුපියල් දශ ලක්ෂ 42; 1960 රුපියල් දශ ලක්ෂ 27; 1961 රුපියල් දශ ලක්ෂ 24, 1962 රුපියල් දශ ලක්ෂ 46; 1963 රුපියල් දශ ලක්ෂ 82; 1964 රුපියල් දශ ලක්ෂ 79; 1965 රුපියල් දශ ලක්ෂ 80; 1966 රුපියල් දශ ලක්ෂ 189; සහ 1967 රුපියල් දශ ලක්ෂ 221; 1968 රුපියල් දශ ලක්ෂ 30.3

(ඈ) ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් යටතේ වගකීම්වල වෙනස් වීම්ද, පී. එල්. 480 ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වෙළෙඳ බැංකුවල විදේශීනට ඇති වගකීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ලද ශුද්ධ මුදල් ඇතුළත් වෙයි. 1964, 1965, 1966, 1967, සහ 1968 සංඛ්‍යාවනට සහල් ආනයන සඳහා බුරුමයට දිය යුතු ප්‍රමාණය ඇතුළත් වෙයි.

(ඉ) 1959 රුපියල් දශ ලක්ෂ 24ක් ද, 1964 රුපියල් දශ ලක්ෂ 60 ක් ද 1965 රුපියල් දශ ලක්ෂ 25 ක් ද, ප්‍රධාන වශයෙන් රන් පවුම් ණය අරමුදල්වලින් ආපසු ගෙවන ලද රන්පවුම් ණය ඇතුළත් නොවේ.

(ඊ) 1961 සහ 1962 දී රුපියල් දශ ලක්ෂ 53.8 බැගින් හා 1965 දී රුපියල් දශ ලක්ෂ 109.4, 1966 දී රුපියල් දශ ලක්ෂ 144.0 හා 1967 දී රුපියල් දශ ලක්ෂ 122.6 ක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් මුදල් ඇතුළත්ය. එයින් කලින් කල ලබා ගන්නා ලද ණය මුදල්වල නැවත ගෙවීම් වන 1965 රුපියල් දශ ලක්ෂ 35.7 ක් ද, 1966 රුපියල් දශ ලක්ෂ 53.6 ක්, 1967 රුපියල් දශ ලක්ෂ 17.9ක් හා 1968 රුපියල් දශ ලක්ෂ 47.7 ක් ද අඩු කොටය. තවද, 1965 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ සලාකය, ඩොලර් දශ ලක්ෂ 45න් ඩොලර් දශ ලක්ෂ 62 දක්වා වැඩිවීම සහ 1966 දී ඩොලර් ලක්ෂ 78 දක්වා වැඩිවීම හේතු කොට ගෙන, 1965 සහ 1966 දී පිළිවෙළින් දක්නට ලැබුන රුපියල් දශ ලක්ෂ 20.2 සහ රුපියල් දශ ලක්ෂ 19.0ක් වූ රන් දීමනා අඩු කොටය.

(උ) තාවකාලිකයි.

## සංඛ්‍යා සටහන II (උ) 2

## ලංකාවේ ගෙවුම් ශේෂය (අ)

එ. ජ. ඩොලර් දශ ලක්ෂ

| වර්ෂය | (1) අපනයන (මුළු) | (2) ආනයන (මුළු) | (3) වෙළෙඳ ශේෂය (I) එකතුව | (3) වෙළෙඳ ශේෂය (II) (එයින් වෙළෙඳ ගනුදෙනු) (ආ) | (4) ශුද්ධ අදිසි (භාණ්ඩ වශයෙන් ලැබුණු තෑගි ඇතුලුව) | (5) ශේෂය වර්තන ගිණුම්හි 3 (1) සහ (4) එකතුව (ශුද්ධ) | (5) ශේෂය එයින් වෙළෙඳ ගනුදෙනු සඳහා වර්තන ගිණුම් ශේෂය | (6) දිගු කාලීන ප්‍රාග්ධන (ඇ) | (7) මූලික ශේෂය (5) සහ (6) එකතුව (ශුද්ධ) | (8) කෙටිකාලී ප්‍රාග්ධන (ශුද්ධ) (ඈ) | (9) වැරදීම් හා අත්හැරීම් | (10) විදේශීය වත්කම්හි වෙනස (වැඩිවීම්) + | (11) කාලච්ඡේදය අවසානයේදී මුළු විදේශීය වත්කම් | (12) වත්කම් (රන්පවුම් ණයනිදන් අරමුල් අත්හැර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 ... | 350 | 370 | — 20 | — 9 | — 21 | — 41 | — 27 | — 4 | — 45 | — | — | — 45 | 223 | 204 |
| 1958 ... | 341 | 360 | — 19 | — 2 | — 13 | — 32 | — 25 | + 2 | — 30 | + 6 | — 3 | — 27 | 196 | 176 |
| 1959 ... | 372 | 411 | — 39 | — 10 | — 5 | — 44 | — 14 | + 7(ඉ) | — 37 | — | — | — 37(ඉ) | 154 | 138 |
| 1960 ... | 358 | 421 | — 44 | — 27 | — 2 | — 46 | — 13 | + 5 | — 41 | + 5 | + 6 | — 40 | 114 | 96 |
| 1961 ... | 358 | 377 | — 19 | — 1 | — 1 | — 20 | — 10 | + 2 | — 18 | + 20(ඊ) | — 4 | — 2 | 112 | 93 |
| 1962 ... | 370 | 400 | — 30 | — 10 | + 1 | — 29 | — 17 | + 8 | — 21 | + 9(ඊ) | + 6 | — 6 | 106 | 85 |
| 1963 ... | 358 | 392 | — 34 | — 6 | — 1 | — 35 | — 16 | + 17 | — 18 | + 9 | — | 9 | 97 | 75 |
| 1964 ... | 371 | 411 | — 40 | — 8 | + 7 | — 33 | — 17 | + 14(ඉ) | — 19 | + 7 | — 1 | + 11(ඉ) | 74 | 64 |
| 1965 ... | 401 | 404 | — 3 | + 27 | + 15 | + 12 | + 29 | + 12(ඉ) | + 24 | + 1(ඊ) | — 1 | — 24(ඉ) | 92 | 86 |
| 1966 ... | 352 | 424 | — 72 | — 25 | + 11 | — 61 | — 28 | + 29 | — 32 | + 11(ඊ) | — 5 | — 26 | 94 | 59 |
| 1967 ... | 347 | 417 | — 70 | — 18 | + 10 | — 60 | — 18 | + 34 | — 26 | + 57 | — 24 | + 28 | — | 85 |
| 1968 ... | 332(උ) | 393 | — 61 | — 5 | + 3 | — 58 | — 9 | + 38 | — 20 | + 26 | — 4 | + 2 | 78 | 70 |

(අ) විදේශීය ලැබීම් හා ගෙවුම් පිළිබඳ විනිමය පාලන සංඛ්‍යා තොරතුරු පදනම් කර ගන්නා ලදී.

(ආ) පහත සඳහන් දෑ ඇතුළත් වෙයි. (1) වෙළෙඳ බැංකුවල විදේශීය විනිමය ගනුදෙනු. (2) වෙළෙඳ බැංකුවල නේවාසික නොවන ගිණුම් (3) මහ බැංකුවේ විදේශීය විනිමය කටයුතු (4) ගෙවුම් ගිවිසුම් ගනුදෙනු සහ (5) විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින ව්‍යාපාරික ආයතන (එනම්, රන් පවුම් වැව්ලි සමාගම් සහ වෙළෙඳුන්ගේ ගිණුම්) විසින් කරන ලද ගනුදෙනු.

(ඇ) පෞද්ගලික හා රජයේ දිගු කාලීන ශුද්ධ සංචලන ඇතුළති. බැර සංඛ්‍යා පහත සඳහන් පරිදි වෙයි. 1957 ඩොලර් දශ ලක්ෂ 4.8, 1958 ඩොලර් දශ ලක්ෂ 4.8, 1959 ඩොලර් දශ ලක්ෂ 8.8, 1960 ඩොලර් දශ ලක්ෂ 5.7, 1961 ඩොලර් දශ ලක්ෂ 5.0, 1962 ඩොලර් දශ ලක්ෂ 9.7, 1963 ඩොලර් දශ ලක්ෂ 7.2, 1964 ඩොලර් දශ ලක්ෂ 16.6, 1965 ඩොලර් දශ ලක්ෂ 16.8, 1966 ඩොලර් දශ ලක්ෂ 39.7, 1967 ඩොලර් දශ ලක්ෂ 46.4, 1968 ඩොලර් දශ ලක්ෂ 50.9.

(ඈ) ද්විපාර්ශ්වීය වෙළෙඳ සහ ගෙවීමේ ගිවිසුම්, 480 වැනි ජ. නී. ප්‍රතිපාර්ශ්වීය අරමුදල්, නේවාසික නොවන්නන්ට ඇති වෙළෙඳ බැංකුවල වගකීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආපසු ලබා ගන්නා ශුද්ධ ලබා ගැනීම් යටතේ වගකීම්වල පවත්නා වෙනස්කම්වලින් සංයුක්ත වේ. 1964, 1965, 1966 සහ 1967 සංඛ්‍යාවන්ට සහල් ආනයනය සඳහා බුරුමයට දිය යුතු ප්‍රමාණය ඇතුළත් වෙයි.

(ඉ) ලබාගත හැකි රන් පවුම් ණය නිදන් අරමුදල්වලින් 1959 දී ඩොලර් දශ ලක්ෂ 5.0 ක් ද, 1964 දී ඩොලර් දශ ලක්ෂ 12.6 ක් ද සහ 1965 දී ඩොලර් දශ ලක්ෂ 5.3 ක් ද ප්‍රධාන වශයෙන් රන් පවුම් ණය ආපසු ගෙවීම අත්හැර තිබේ.

(ඊ) 1965 දී ඩොලර් දශ ලක්ෂ 7.5 ක් වූ ද, 1966 ඩොලර් දශ ලක්ෂ 11.3 ක් වූ ද, 1967 දී ඩොලර් දශ ලක්ෂ 3.8 ක් වූ ද, 1968 දී ඩොලර් දශ ලක්ෂ 8.0ක් වූ ද, ආපසු ගෙවීම් අඩු කරන කරන ලද, 1961 දී සහ 1962 දී ඩොලර් දශ ලක්ෂ 11.3 1965 දී ඩොලර් දශ ලක්ෂ 23.0 සහ 1966 දී ඩොලර් දශ ලක්ෂ 30.2, 1967 දී ඩොලර් දශ ලක්ෂ 25.7 සහ 1968 දී ඩොලර් දශ ලක්ෂ 35.8ක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කලින් ගත් ආපසු ලබා ගැනීම් ඇතුළත්ය. සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකා සලාකයෙහි 1965 දී ඩොලර් දශ ලක්ෂ 45 සිට ඩොලර් දශ ලක්ෂ 62 දක්වා 1966 දී ඩොලර් දශ ලක්ෂ 75 දක්වා ද වැඩිවීම හේතු කොට ගෙන 1965 දී රුපියල් දශ ලක්ෂ 4.2 ක් වූ ද, 1966 දී ඩොලර් දශ ලක්ෂ 4.0 ක් වූ ද රත්‍රං දයක දීමනා ඇතුළත් නොවේ.

(උ) තාවකාලික.

## සංඛ්‍යා සටහන II (උ) 3.

## විදේශීය මුදල් මාර්ග සහ ඒවා යෙදවූ අයුරු

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසෙහි සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 |
| **(අ) මුදල් මාර්ග** | | | | | | | | |
| 1. වෙළෙඳ භාණ්ඩ අපනයන නැ. වි. ස. ... | 1909 | 1674 | 1650 | 1975 | 81 | 70 | 70 | 70 |
| 2. ජංගම අදිසි ... | 199 | 204 | 216 | 212 | 8 | 9 | 8 | 8 |
| 3. ප්‍රාග්ධන ලැබීම් ... | 141 | 226 | 261 | 340 | 6 | 9 | 11 | 12 |
| ඒවායින්, | | | | | | | | |
| (අ) ණය (1) ... | 77 | 173 | 212 | 295 | 3 | 7 | 9 | 10 |
| (ආ) දීමනා (1) ... | 64 | 51 | 46 | 42 | 3 | 2 | 2 | 2 |
| (ඇ) පෞද්ගලික ප්‍රාග්ධන ... | — | 2 | 3 | 3 | — | — | — | — |
| 4. කෙටි කාලීන වගකීම් ... | 109 | 175 | 275 | 284 | 5 | 7 | 11 | 10 |
| ඒවායින්, | | | | | | | | |
| (අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීම් (2) ... | 109 | 144 | 123 | 213 | 5 | 6 | 5 | 8 |
| (ආ) ද්විපාර්ශ්වීය ගෙවීම් ගිවිසුම් ශේෂයේ වැඩිවීම ... | — | 31 | 80 | 42 | — | 1 | 3 | 1 |
| (ඇ) විදේශීය බැංකුවලින් ණය ගැනීම් | — | — | 57 | 29 | — | — | 2 | 1 |
| (ඈ) අනෙකුත් ... | — | — | 15 | — | — | — | 1 | — |
| 5. විදේශීය වත්කම් අඩුවීම (රන්පවුම් ණය සහ නිදන් අරමුදල් අඩු කොට) | — | 126 | — | — | — | 5 | — | — |
| එකතුව ... | 2359 | 2405 | 2402 | 2811 | 100 | 100 | 100 | 100 |
| **(ආ). යෙදවූ අයුරු** | | | | | | | | |
| 6. වෙළෙඳ භාණ්ඩ ආනයන මි.ර.ගැ. ... | 1922 | 2018 | 1985 | 2341 | 81 | 84 | 83 | 84 |
| ඒවායින්, ආධාර ... | 142 | 224 | 258 | 337 | 6 | 11 | 11 | 12 |
| 7. ජංගම අදිසි ... | 199 | 213 | 216 | 234 | 9 | 9 | 9 | 8 |
| (අ) ආයෝජන ආදායම ... | 4 | 26 | 32 | 34 | — | 1 | 1 | 1 |
| (ආ) සංක්‍රාමිකයන්ගේ පැවරීම් ... | 31 | 32 | 31 | 27 | 1 | 1 | 1 | 1 |
| (ඇ) පොලී ගෙවීම් ... | 22 | 21 | 33 | 40 | — | 1 | 1 | 1 |
| 8. ප්‍රාග්ධන ක්‍රමක්ෂය හෝ ආපසු ගෙවීම් | 75 | 114 | 73 | 117 | 3 | 4 | 3 | 4 |
| (අ) පෞද්ගලික ... | 3 | 8 | 10 | 10 | — | — | — | — |
| (ආ) නිල ... | 16 | 30 | 45 | 59 | — | 1 | 2 | 2 |
| (ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ප්‍රතිමිලට ගැනීම් හා රත්රන් දයක දීමනා ... | 56 | 76 | 18 | 48 | 2 | 3 | 1 | 2 |
| 9. කෙටිකාලීන වගකීම් (3) ... | 69 | 62 | — | 78 | 3 | 3 | — | 3 |
| 10. විදේශීය වත්කම් වැඩිවීම (රන් පවුම් නිදන් අරමුදල් අඩුකොට) ... | 103 | — | 125 | 10 | 4 | — | 5 | — |
| 11. ශීර්ෂ තුලනය ... | —9 | —2 | +3 | +31 | — | — | — | —1 |
| එකතුව ... | 2359 | 2405 | 2402 | 2811 | 100 | 100 | 100 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහා බැංකුව

(1) යෝජනා ක්‍රම ආධාර සහ ද්‍රව්‍යාධාරවල ස්වරූපයෙන් ලැබුණු ආධාර ඇතුළත් වේ.

(2) 1966 දී එ. ජ. ඩොලර් දශ ලක්ෂ 62 ක්ව පැවැති ලංකාවේ සලාකය එ. ජ. ඩොලර් 78 දක්වා වැඩිවීම නිසා ගෙවිය යුතු රන් දයක දීමනාව සඳහා වූ රුපියල් දශ ලක්ෂ 19ට 1966 විශේෂ ලබා ගැනීම් ඇතුළත් වේ.

(3) කෙටි කාලීන වගකීම් ද්විපාර්ශවීය ගෙවීම් ගිවිසුමේ ශේෂයන්, විශේෂ ගිණුම් පහසුකම් ලබන ව්‍යාපාරික ආයතනයන්ගේ ශේෂයන්හි වෙනස සහ ආහාර කොමසාරිස් ගේ ආනයනයන් හේතු කොට ගෙන පමා වූ ගෙවීම්වලින් සමන්විත වෙයි.

## සංඛ්‍යා සටහන II (උ) 4

## ජංගම අදිසි 1967 සහ 1968

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1967 | | | 1968 තාවකාලිකයි. | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **සේවා** | **209.9** | **185.6** | **+ 24.3** | **203.8** | **206.5** | **— 2.7** |
| මුදල් නොවන රන් (ශුද්ධ) | — | 1.7 | — 1.7 | — | 2.6 | — 2.6 |
| ප්‍රවාහනය | 129.8 | 15.0 | +114.8 | 117.1 | 15.4 | +101.7 |
| සංචාර | 5.9 | 16.8 | — 10.9 | 10.3 | 20.0 | — 9.7 |
| ආයෝජන ආදයම | 11.1 | 64.6 | — 53.5 | 13.5 | 74.0 | — 60.5 |
| සෘජු ආයෝජන | 0.7 | 32.1 | — 31.4 | 1.5 | 34.0 | — 32.5 |
| අනෙකුත් | 10.4 | 32.5 | — 22.1 | 12.0 | 40.0 | — 28.0 |
| රජයේ වියදම් | 24.1 | 12.0 | + 12.1 | 24.0 | 16.0 | + 8.0 |
| අනෙකුත් සේවා | 39.0 | 75.5 | — 36.5 | 38.9 | 78.5 | — 39.6 |
| **සංක්‍රාම ගෙවුම්** | **52.5** | **30.7** | **+ 21.8** | **50.1** | **27.1** | **— 23.0** |
| පෞද්ගලික ගෙවුම් | 6.6 | 30.7 | — 24.1 | 7.7 | 27.1 | — 19.4 |
| නිල ගෙවුම් | 45.9 | — | + 45.9 | 42.4 | — | + 42.4 |
| එකතුව | 262.4 | 216.3 | + 46.1 | 253.9 | 233.6 | + 20.3 |

## සංඛ්‍යා සටහන II (උ) 5
## 1967 සහ 1968 — ආධාර පැමිණීම

| | ද්‍රව්‍යාධාර | | | | | | යෝජනා ක්‍රම ආධාර | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | එ. ජ. ඩොලර් දශ ලක්ෂ | | | රුපියල් දශ ලක්ෂ | | | එ. ජ. ඩොලර් දශ ලක්ෂ | | |
| | 1967 | 1968 | වෙනස | 1967 | 1968 | වෙනස | 1967 | 1968 | වෙනස | 1967 | 1968 | වෙනස |
| 1. පාරිභෝජන භාණ්ඩ | | | | | | | | | | | | |
| තිරිඟු පිටි ... | 23.5 | 114.4 | +90.9 | 4.94 | 19.22 | +14.28 | — | — | — | — | — | — |
| කිරි නිෂ්පාදිත ... | — | 0.4 | + 0.4 | — | 0.07 | + 0.07 | — | — | — | — | — | — |
| මාළු සහ පිළියෙළ කළ මාළු | 4.4 | — | — 4.4 | 0.92 | — | — 0.92 | — | — | — | — | — | — |
| වෙනත් ආහාර ... | — | 3.0 | + 3.0 | — | 0.50 | + 0.50 | — | — | — | — | — | — |
| බෙහෙත් වර්ග ... | 1.0 | 0.6 | — 0.4 | 0.21 | 0.10 | — 0.11 | — | — | — | — | — | — |
| රෙදිපිළි ... | 15.4 | — | —15.4 | 3.23 | — | — 3.23 | — | — | — | — | — | — |
| ටයර් සහ ටියුබ් ... | 14.3 | 5.3 | — 9.0 | 3.00 | 0.89 | — 2.11 | — | — | — | — | — | — |
| | 58.6 | 123.7 | +65.1 | 12.30 | 20.78 | + 8.48 | — | — | — | — | — | — |
| 2. අන්තර් භාණ්ඩ | | | | | | | | | | | | |
| පොහොර ... | 43.0 | 62.3 | +19.3 | 9.03 | 10.47 | + 1.44 | — | — | — | — | — | — |
| බීජ අර්තාපල් ... | — | 0.5 | + 0.5 | — | 0.08 | + 0.08 | — | — | — | — | — | — |
| කඩදාසි හා මුද්‍රණ කඩදාසි ... | 0.9 | 0.4 | — 0.5 | 0.19 | 0.07 | — 0.12 | — | — | — | — | — | — |
| ඉංජිනේරු භාණ්ඩ තොග ... | 4.5 | 2.2 | — 2.3 | 0.94 | 0.37 | — 0.57 | — | — | — | — | — | — |
| කර්මාන්ත අමු ද්‍රව්‍ය ... | 20.9 | 12.6 | — 8.3 | 4.39 | 2.12 | — 2.27 | — | — | — | — | — | — |
| | 69.3 | 78.0 | + 8.7 | 14.55 | 13.11 | — 1.44 | — | — | — | — | — | — |
| 3. ආයෝජන භාණ්ඩ | | | | | | | | | | | | |
| යන්ත්‍ර ... | 37.5 | 30.7 | — 6.8 | 7.87 | 5.16 | — 2.71 | 33.5 | 40.2 | +6.7 | 7.03 | 6.75 | —0.28 |
| ට්‍රැක්ටර් සහ අමතර කොටස් | 15.5 | 6.3 | — 9.2 | 3.26 | 1.06 | — 2.20 | — | — | — | — | — | — |
| ප්‍රවාහන උපකරණ ... | 14.7 | 29.8 | +15.1 | 3.09 | 5.00 | + 1.91 | — | — | — | — | — | — |
| ගොඩනැගිලි ද්‍රව්‍ය ... | 6.2 | 3.9 | — 2.3 | 1.30 | 0.66 | — 0.64 | — | — | — | — | — | — |
| යෝග්‍යතා නිරීක්ෂණ ... | — | 0.4 | + 0.4 | — | 0.07 | + 0.07 | — | — | — | — | — | — |
| | 73.9 | 71.8 | — 2.8 | 15.52 | 11.95 | — 3.57 | 33.5 | 40.2 | +6.7 | 7.03 | 6.75 | —0.28 |
| එකතුව ... | 201.8 | 272.4 | +70.6 | 42.37 | 45.84 | + 3.47 | 33.5 | 40.2 | +6.7 | 7.03 | 6.75 | —0.28 |

මූලය : ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය; මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව.

1. එ. ජ., ජ. නී. 480 යටතේ ගිවිස ගත් රුපියල් දශ ලක්ෂ 4.5 ක් වූ පිටි ආනයන සහ රුපියල් දශ ලක්ෂ 1.4 ක් වූ ඉරිඟු ආනයනයන් ඇතුළත් කර නොමැත.

## සංඛ්‍යා සටහන II (ඇ) 6

## ලංකාවේ රාජ්‍ය විදේශීය වගකීම් (දළ)*

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | (1) ප්‍රමාණය 1967 අවසානයට | (2) ප්‍රමාණය 1968 අවසානයට | (3) වෙනස |
|---|---|---|---|
| 1. ජා. මු. අරමුදලෙන් ගත් ණය ... ... | 376.1 | 541.6 | +165.5 |
| 2. රන් පවුම් ණය ... ... ... ... | 89.3 | 89.3 | ... |
| 3. ණයට ගෙන පියවා නොමැති විදේශීය ණය ... | 517.8 | 533.7 | + 15.9 |
| 4. සහභාගි රටවල ආධාර ... ... ... | 333.5 | 606.3 | +272.8 |
| 5. ආහාර කොමසාරිස් ගේ විලම්බිත බදු ... | 53.7 | 39.7 | — 14.0 |
| 6. ලංකාවෙන් අයවිය යුතු ගිවිසුම් ගෙවීම් ශේෂ | 110.4 | 197.8 | + 87.4 |
| 7. විදේශීය බැංකුවලින් කළ ලබා ගැනීම් ... | 57.1 | 28.6 | — 28.5 |
| එකතුව ... ... ... ... | 1537.9 | 2037.0 | +499.1 |

* විදේශීය විනිමය වලින් ගෙවීමට ඇති වගකීම්වලට ජන නීති 480 යටතේ ඇති ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ශේෂ සහ වෙළෙඳ බැංකු වෙතැති නේවාසික නොවන අයගේ ශේෂ ඇතුලත් නොවේ.

(1) වර්ෂය තුලදී ජා. මු. අ. සමග පැවති ගනුදෙනුවලට රුපියල් දශ ලක්ෂ 213.2 ක් ලබා ගැනීම් සහ රුපියල් දශ ලක්ෂ 47.7 ක ආපසු ගෙවීම් ඇතුළත්ය.

ලංකා රුපියල්වලින් ගෙවන ලද සේවා ගාස්තු ඇතුළත් කර නොමැත.

(2) සහ (3) 1967 නොවැම්බරයේදී ලංකා රුපියල අවප්‍රමාණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් අගය අනුව වගකීම්වල ඇති වූ වැඩිවීම් ඇතුළත් කිරීම් වස් 1968 වසර සඳහා වූ සංඛ්‍යාවන් ගලපන ලදී.

(4) ඇ. එ. ජ., එ. රා., ජ. පෙ ස., ජපානය, ඉන්දියාව, කැනඩාව සහ ප්‍රංශය යන රටවලින් පළමු වැනි දෙවැනි, තුන්වැනි සහ හතර වැනි ද්‍රව්‍යාධාර වැඩ පිළිවෙළ යටතේ ලැබුණු ද්‍රව්‍යාධාරවලින් සමන්විත වෙයි

(5) ප්‍රමාද වූ ගෙවීම් නියමයන් යටතේ, (1) බුරුමයෙන් සහල් (2) ඕස්ට්‍රේලියාවෙන් සහ ප්‍රංශයෙන් තිරිඟු පිටි, ආනයනයන් සඳහා ආහාර කොමසාරිස්වරයා ගේ වගකීම් ඇතුළත් වෙයි.

(6) ඉකුත් වසරේ ගනුදෙනුවට අනුරූපී වන පරිදි 1968 අවසානයට වූ මුළු ශේෂයන් ගලපා ඇත.

1967 ගිවිසුම යටතේ චීනයට යැවුනු රබර් තොගවල මිල ගැලපීම් නිසා වගකීම්වල ඇතිවූ වැඩිවීම් 1968 ශේෂයට ඇතුළත් කර නොමැත.

## II (ළ) 7 සංඛ්‍යා සටහන

### ලංකාවේ සුළු අපනයනයන් ගේ පරිමාව — 1967 සහ 1968

| ශීර්ෂය | ප්‍රමාණය '000 ගණනින් | වැඩිවීම 1967 | වැඩිවීම 1968 | වැඩිවීම %වෙනස | අඩුවීම 1967 | අඩුවීම 1968 | අඩුවීම %වෙනස |
|---|---|---|---|---|---|---|---|
| **1. මූලික නිෂ්පාදිත** | | | | | | | |
| පුවක් | ... හොණ්. | | | | 5.5 | 5.1 | —7 |
| බුලත් | ... ,, | | | | 1.4 | 1.3 | —7 |
| කරඳ මුංගු | ... ,, | 2.4 | 2.5 | 4 | | | |
| පොල්කටු අඟුරු | ... ,, | 273.0 | 319.0 | 17 | | | |
| කුරුඳු කැලි | ,, | 7.9 | 16.6 | 110 | | | |
| කුරුඳු පොතු | ... ,, | 52.8 | 61.8 | 17 | | | |
| කුරුඳු පොතු තෙල් | ...රාත්තල් | | | | 1.5 | 1.4 | —7 |
| කුරුඳු කොළ තෙල් | ... ,, | 43.5 | 79.2 | 82 | | | |
| පැඟිරි තෙල් | ... ,, | | | | 337.7 | 297.8 | —12 |
| කරාබු නැටි | ... හොණ්. | .85 | .95 | 12 | | | |
| කොකෝවා | .. ,, | 23.2 | 34.8 | 50 | | | |
| පීරපු කොහු | ... ,, | 538.0 | 563.9 | 5 | | | |
| කොහු මෙට්ට | ... ,, | 1065.0 | 1260.3 | 18 | | | |
| කොහු කැරලි | ... ,, | | | | 7.0 | 5.7 | —19 |
| සීත කළ හා අධි ශීත කළ මාළු | ... ,, | | 309.5 | | | | |
| වියලි හෝ දුම් ගැසූ මාළු | ... ,, | | | | 3.7 | 1.5 | —59 |
| ඉල්මනයිට් | ... ,, | | | | 1764.4 | 1455.0 | —18 |
| ඉඹුල් පුළුන් | ... ,, | 4.3 | 7.1 | 65 | | | |
| හම් (එළු) | ... ,, | 2.5 | 3.3 | 32 | | | |
| පදම් කළ හම් | ... ,, | 7.7 | 10.1 | 31 | | | |
| මයිකා | ... ,, | 2.1 | 2.6 | 24 | | | |
| සාදික්කා | ... ,, | .76 | 2.1 | 176 | | | |
| පැපොල් කිරි (සුදු) | ... ,, | | | | .18 | .13 | —28 |
| පැපින් (දුඹුරු) | ... ,, | .19 | 2.6 | 36 | | | |
| ගම්මිරිස් | ... ,, | 2.0 | 16.2 | 710 | | | |
| මිනිරන් | ... ,, | 204.1 | 212.6 | 4 | | | |
| මැණික් හා අර්ධ මැණික් ගල් | ... කැරට් | 24.9 | 196.0 | 687 | | | |
| මෝරවරල් | ...හොණ්. | | | | 1.6 | 1.1 | —31 |
| සකස් නොකළ දුම්කොළ | ...රාත්තල් | 942.2 | 1340.2 | 42 | | | |
| එළවළු සාර | ...හොණ්. | | | | 25.8 | 7.6 | —71 |
| **II. නිෂ්පාදිත භාණ්ඩ** | | | | | | | |
| ඇලුමිනියම් භාණ්ඩ | ...හොණ්. | .17 | .92 | 441 | | | |
| යකඩ හා වානේ භාණ්ඩ | ... ,, | | | | 3.5 | 2.3 | —34 |
| බේකරි නිෂ්පාදිත | ... ,, | .25 | .26 | 4 | | | |
| සපත්තු—රබර් අඩි ගැසූ | ... දුසිම් | 4.8 | 10.4 | 117 | | | |
| චොකලට් සහ කොකෝවා | ...රාත්තල් | .49 | 4.6 | 839 | | | |
| රෙදිපිළි | ... දුසිම් | 3.7 | 32.3 | 773 | | | |
| කපුවලින් නිෂ්පාදිත භාණ්ඩ | ... ,, | 10.9 | 25.0 | 129 | | | |
| ටින්වල හෝ බෝතල්වල ඇසුරු පළතුරු | ...හොණ්. | .8 | 4.5 | 463 | | | |
| ග්ලිසරින් | ... | — | 20.9 | — | | | |
| ග්ලිසරෝල් | ... | 21.8 | 24.8 | 13 | | | |
| ස්වර්ණාභරණසහ රන්කරුවන්ගේ ආභරණ | | | | | | | |
| ටියම් තුනී පත්‍ර, කුඩු සහ තුනී පත්‍ර | ...හොණ්. | 10.7 | 15.4 | 44 | | | |
| ලියෙන් කළ භාණ්ඩ | | | | | | | |
| සබන් | ... | .58 | .74 | 28 | | | |
| විද්‍යුත් සංග්‍රාහය | | 1.3 | 1.5 | 15 | | | |
| තේ යන්ත්‍රවල වියලීමේ කොටස් | ... | .03 | .03 | — | | | |
| වේවැල් වැඩ | | .13 | .78 | 500 | | | |

මූලය: ලංකා රේගුව.

## II (උ) 8 සංඛ්‍යා සටහන

### ලංකාවේ සුළු අපනයනයන්ගේ වටිනාකම — 1967 සහ 1968

වටිනාකම එ. ජ. ඩොලර් 1000

| ශීර්ෂය | වැඩිවීම | | | අඩුවීම | | |
|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | % ට වෙනස | 1967 | 1968 | % ට වෙනස |
| **1. මූලික නිෂ්පාදිත** | | | | | | |
| පුවක් ... | 30.8 | 41.2 | 34 | | | |
| බුලත් ... | | | | 30.3 | 22.4 | —26 |
| කරදමුංගු ... | 688.3 | 690.9 | 0.38 | | | |
| පොල්කටු අඟුරු ... | | | | 1033.1 | 875.9 | —15 |
| කුරුඳු කැලි ... | 255.3 | 394.2 | 54 | | | |
| කුරුඳු පොලු ... | | | | 6260.4 | 5522.3 | —31 |
| කුරුඳුපොතු තෙල් ... | | | | 91.8 | 63.5 | —31 |
| කුරුඳු කොළ තෙල් ... | 94.5 | 139.7 | 48 | | | |
| පැඟිරි තෙල් ... | 173.1 | 199.5 | 15 | | | |
| කරාබු නැටි ... | 18.7 | 20.8 | 11 | | | |
| කොකෝවා ... | 870.1 | 1233.0 | 42 | | | |
| පිරපු කොහු කෙඳි ... | | | | 4626.1 | 4296.0 | —7 |
| කොහු මෙට්ට ... | 4079.9 | 4283.3 | 5 | | | |
| කොහු කැරලි ... | | | | 99.9 | 73.8 | —26 |
| ශීත කළ හා අධි ශීත කළ මාළු ... | — | 76.5 | | | | |
| වියලි හෝ දුම්ගැසූ මාළු ... | | | | 87.9 | 61.5 | —30 |
| ඉල්මනයිට් ... | 319.9 | 434.6 | 36 | | | |
| ඉඹුල් පුළුන් ... | 62.2 | 92.2 | 48 | | | |
| හම් (එළු) ... | 179.1 | 187.3 | 5 | | | |
| පදම් කළ හම් ... | | | | 327.3 | 306.3 | —6 |
| මයිකා ... | 5.4 | 7.3 | 35 | | | |
| සාදික්කා ... | 29.8 | 61.4 | 106 | | | |
| පැපොල් කිරි (සුදු) ... | 48.1 | 50.7 | 5 | | | |
| පැපොල් කිරි (දුඹුරු) ... | 40.4 | 54.7 | 35 | | | |
| ගම්මිරිස් ... | 92.2 | 398.1 | 332 | | | |
| මිනිරන් ... | | | | 1406.9 | 1318.5 | —6 |
| අගනා මැණික් හා බාල මැණික් ගල් ... | | | | 728.9 | 340.8 | —53 |
| මෝර වරල් ... | | | | 127.9 | 80.2 | —37 |
| සකස් නොකළ දුම්කොළ ... | 593.1 | 857.1 | 45 | | | |
| එළවළු සාර ... | | | | 96.4 | 24.3 | —75 |
| **11. නිෂ්පාදිත භාණ්ඩ** | | | | | | |
| ඇලුමිනියම් භාණ්ඩ ... | 13.3 | 22.4 | 68 | | | |
| යකඩ හා වානේ භාණ්ඩ ... | 13.6 | 72.9 | 436 | | | |
| බේකරි නිෂ්පාදිත ... | | | | 6.1 | 2.9 | —52 |
| රබර් අඩි ගැසූ බූට්ස් හා සපත්තු ... | 20.3 | 50.5 | 149 | | | |
| චොකලට් සහ කොකෝවා නිෂ්පාදිත ... | 12.6 | 22.8 | 81 | | | |
| රෙදිපිළි ... | .88 | 700.9 | 79548 | | | |
| කපුවලින් නිෂ්පාදිත භාණ්ඩ ... | | | | 226.2 | 106.5 | —53 |
| ටින්වල හෝ බෝතල්වල ඇසුරු පළතුරු... | 11.8 | 45.8 | 288 | | | |
| ග්ලිසරින් ... | — | 328.4 | | | | |
| ග්ලිසරෝල් ... | | | | 410.8 | 327.5 | —20 |
| ස්වර්ණාභරණ සහ රන්කරුවන්ගේ භාණ්ඩ | | | | 490.8 | 198.5 | —60 |
| රියම් තුනීපත්‍ර, කුඩු සහ තුනී පත්‍ර ... | | | | 121.1 | 113.5 | —6 |
| ලීයෙන් කළ භාණ්ඩ ... | 47.5 | 51.5 | 8 | | | |
| සබන් ... | | | | 21.2 | 19.8 | —98 |
| තේ යන්ත්‍රවල වියලීමේ කොටස් ... | 31.5 | 90.3 | 187 | | | |
| වේවැල් වැඩ ... | 7.5 | 36.0 | 481 | | | |

මූලය: ලංකා රේගුව

## II ( උ) 9 සංඛ්‍යා සටහන

### විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර වැඩ පිළිවෙල යටතේ ආනයන ගෙවුම්
### (ආ) වර්ගයේ කොටස් ප්‍රමාණය සහ විවෘත සාමාන්‍ය බලපත්‍ර ආනයන

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | වර්ග එකතුවේ ප්‍රතිශතය | වර්ග එකතුවේ ඇති මුළු එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **0. ආහාරපාන... ... ... ...** | **14.6** | **100.0** | **7.9** |
| කිරි ආහාර සහ බිත්තර ... ... | 4.2 | 28.9 | |
| බටර්, චීස් ... ... ... ... | 2.5 | 17.4 | |
| පිටි ආහාර ... ... ... | 3.7 | 25.1 | |
| වෙනත් ... ... ... ... | 4.2 | 28.6 | |
| **1. බීම වර්ග සහ දුම්කොළ ...** | **1.5** | **100.0** | **0.8** |
| මද්‍යසාර සහිත බීම ... ... ... | 0.7 | 49.0 | |
| නිෂ්පාදනය නොකළ දුම්කොළ ... | 0.8 | 51.0 | |
| **2. ශුද්ධ නොකළ ද්‍රව, ඉන්ධන අත්හැර ...** | **9.0** | **100.0** | **4.9** |
| කපු ... ... ... ... | 2.8 | 30.8 | |
| ශුද්ධ නොකළ එළවළු ද්‍රව්‍ය ... ... | 4.1 | 45.9 | |
| වෙනත් ... ... ... ... | 2.1 | 23.3 | |
| **3. ඛණිජ ද්‍රව, ඉන්ධන, මෝටර් රථ තෙල් ...** | **1.33** | **100.0** | **0.7** |
| පෙට්‍රෝලියම් නිෂ්පාදිත ... ... | 1.28 | 96.5 | |
| වෙනත් ඛණිජ ඉන්ධන, මෝටර් තෙල් ... | 0.05 | 3.5 | |
| **4. සත්ව සහ එළවළු තෙල් සහ මේද ...** | **1.67** | **100.00** | **0.9** |
| සත්ව තෙල් සහමේද... ... ... | 1.51 | 90.7 | |
| වෙනත් එළවළු තෙල් ... ... | .11 | 6.3 | |
| වෙනත් ... ... ... ... | .05 | 3.0 | |
| **5. රසායනික ද්‍රව්‍ය ... ... ...** | **20.7** | **100.00** | **11.2** |
| වෙන්ද්‍රිය රසායනික ... ... ... | 5.4 | 26.2 | |
| ඓන්ද්‍රිය නොවන රසායනික, සහ ලුණු ... | 3.2 | 15.6 | |
| රසායනික ද්‍රව්‍යයන් සහ නිෂ්පාදන ... | 2.9 | 14.2 | |
| වෙනත් ... ... ... ... | 9.2 | 44.0 | |
| **6.—නිෂ්පාදිත භාණ්ඩ ... ... ...** | **77.2** | **100.0** | **41.8** |
| කඩදසි සහ කඩදසි බෝඩ් ... ... | 14.1 | 18.2 | |
| රෙදිපිළි සඳහා වන නූල් ... ... | 11.3 | 14.6 | |
| රබර් භාණ්ඩ ... ... ... | 5.6 | 7.3 | |
| පිහියා සහ නිෂ්පාදිත ලෝහ ... ... | 8.6 | 11.0 | |
| වෙනත් ... ... ... ... | 37.6 | 48.9 | |
| **7. යන්ත්‍රෝපකරණ සහ වාහන උපකරණ** | **48.0** | **100.0** | **25.9** |
| මෝටර් රථ සහ වෙනත් වාහන ... | 18.1 | 37.8 | |
| කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ... | 6.8 | 14.1 | |
| යන්ත්‍රසූත්‍ර සහ මෙවලම් | 6.2 | 12.8 | |
| වෙනත් | 16.9 | 35.3 | |
| **8. වෙනත් නිෂ්පාදිත ද්‍රව්‍යයන් ... ...** | **10.9** | **100.0** | **5.9** |
| ඡායාරූප ශිල්පී සහ චිත්‍රපට උපකරණය | 2.3 | 21.6 | |
| රෙදිපිළි (ඇඳුම් සඳහා නොවන ) | 2.0 | 18.3 | |
| මුද්‍රණශිල්පී අවශ්‍යතා ... ... | 1.4 | 13.1 | |
| විද්‍යාත්මක උපකරණ ... ... | 1.1 | 9.9 | |
| කාර්යාලීය සහ ලිපි ද්‍රව්‍ය ... | 1.0 | 8.8 | |
| සෙල්ලම් බඩු, ක්‍රීඩා භාණ්ඩ ... ... | 0.9 | 8.3 | |
| වෙනත් ... ... ... ... | 2.2 | 20.0 | |
| **මුළු එකතුව ... ... ...** | **184.9** | | **100.0** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික වර්ගයන් අනුව වර්ගීකරණය —මැයි දෙසැම්බර් 1968

| | වටිනාකම (රු. දශ ලක්ෂ) | ප්‍රතිශතය |
|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ ... ... | 42.4 | 22.9 |
| අතර මැදි භාණ්ඩ ... ... | 94.5 | 51.1 |
| ආයෝජන භාණ්ඩ ... ... | 48.0 | 26.0 |
| එකතුව ... ... ... | 184.9 | 100.0 |

**සංඛ්‍යා සටහන II (ඇ) 10**

**වි. සා. බ. ආනයනයන් සඳහා විවෘත කළ ණයවර ලිපි වටිනාකම**

**1968 මැයි – දෙසැම්බර්**

රුපියල් දහස්

| වර්ගය භාණ්ඩය | මැයි | | ජූනි | | ජූලි | | අගෝස්තු | | සැප්තැම්බර් | | ඔක්තෝබර් | | නොවැම්බර් | | දෙසැම්බර් | | මුළු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % |
| 1. ආහාර පාන, බීම වර්ග සහ දුම්කොළ ... | 473.6 | 7.8 | 2,309.5 | 6.5 | 1,801.5 | 3.7 | 1,633.3 | 2.4 | 1,016.2 | 2.9 | 1,761.1 | 4.1 | 668.4 | 2.2 | 432.0 | 1.1 | 10,095.6 | 3.3 |
| 2. ශුද්ධ නොකළ ද්‍රව්‍යයන්, ඉන්ධන අත්කම් ... ... | 194.8 | 3.2 | 1,422.8 | 4.0 | 2,211.9 | 4.5 | 837.2 | 1.2 | 1,634.2 | 4.7 | 2,278.2 | 5.4 | 666.6 | 2.2 | 2,006.1 | 5.0 | 11,251.8 | 3.7 |
| 3. ඛණිජ ඉන්ධන, මෝටර් රථ තෙල් සහ ඒ සම්බන්ධිත ද්‍රව්‍ය ... | — | — | — | — | 217.2 | 0.4 | 738.3 | 1.1 | 64.7 | 0.2 | 63.4 | 0.1 | 62.7 | 0.2 | 177.1 | 0.4 | 1,323.4 | 0.4 |
| 4. සත්ව හා එළවළු තෙල් සහ මේද | — | — | 480.5 | 1.4 | 412.5 | 0.8 | 2,339.3 | 3.5 | 3,196.8 | 9.3 | 3,649.9 | 8.6 | 2,840.1 | 9.2 | 2,431.0 | 6.1 | 15,350.1 | 5.0 |
| 5. රසායනික ද්‍රව්‍ය ... ... | 322.4 | 5.3 | 4,294.1 | 12.1 | 7,250.9 | 14.8 | 1,510.4 | 2.2 | 1,749.2 | 5.1 | 1,827.6 | 4.3 | 2,047.2 | 6.6 | 1,718.2 | 4.3 | 20,720.0 | 6.8 |
| 6. ද්‍රව්‍යයන්ට අනුව වර්ග කරන ලද නිෂ්පාදිත භාණ්ඩ ... ... | 3,063.3 | 50.5 | 17,476.4 | 49.4 | 20,934.6 | 42.7 | 48,932.7 | 72.5 | 15,020.0 | 43.5 | 19,352.2 | 45.5 | 13,208.4 | 42.6 | 17,545.4 | 43.8 | 155,533.0 | 50.8 |
| 7. යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ ... ... ... | 1,522.9 | 25.1 | 6,160.9 | 17.4 | 13,632.0 | 27.8 | 9,501.4 | 14.1 | 9,402.0 | 27.2 | 9,762.0 | 23.0 | 8,321.6 | 26.9 | 13,303.0 | 33.2 | 71,605.8 | 23.4 |
| 8. විවිධ වර්ගයේ නිෂ්පාදිත ද්‍රව්‍ය ... | 485.8 | 8.0 | 33,264.5 | 9.2 | 2,621.4 | 5.3 | 1,987.3 | 2.9 | 2,455.6 | 7.1 | 3,839.6 | 9.0 | 3,154.3 | 10,2 | 2,471.6 | 6.2 | 20,280.1 | 6.6 |
| 9. ගුණනය කළ එකතුව ... ... | 6,062.8 | 100.0 | 35,408.7 | 100.0 | 49,082.0 | 100.0 | 67,479.9 | 100.0 | 34,538.7 | 100.0 | 42,534.0 | 100.0 | 30,969.3 | 100.0 | 40,084.4 | 100.0 | 306,159.8 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඇ) 11 වන සංඛ්‍යා සටහන
## 1968 ආධාර ලැබීම් පිළිබඳ ලේඛනය—ප්‍රදේශ අනුව වර්ග කිරීම

| රට | භාණ්ඩ ආධාර1 | යෝජනා ක්‍රම ආධාර | එකතුව |
|---|---|---|---|
| එක්සත් රාජධානිය ... ... ... | 55.9 | 0.9 | 56.8 |
| ප්‍රංශය ... ... ... ... | 13.9 | | 13.9 |
| ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව ... ... | 25.4 | 7.1 | 32.5 |
| ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ... | | 19.6 | 19.6 |
| පෝලන්තය ... ... ... ... | | 2.1 | 2.1 |
| යුගෝස්ලේවියාව ... ... ... | | 1.2 | 1.2 |
| එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ... | | 1.4 | 1.4 |
| ඇමෙරිකා එක්සත් ජනපදය ... ... | 122.9 | 0.1 | 123.0 |
| කැනඩාව ... ... ... ... | 13.0 | 7.8 | 20.8 |
| ඉන්දියාව ... ... ... ... | 6.4 | | 6.4 |
| ජපානය ... ... ... ... | 28.8 | | 28.8 |
| ඕස්ට්‍රේලියාව ... ... ... ... | 6.5 | | 6.5 |
| එකතුව ... ... ... ... | 272.8 | 40.2 | 313.0 |

මූලය : ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1. භාණ්ඩ ආධාර යටතේ දැක්වෙන රුපියල් දශ ලක්ෂ 272.8 ක්වූ මුළු ගණනින්, එක්සත් ජාතීන්ගේ කාර්මික යෝජනා ක්‍රමය යටතේ, ලැබුණු රුපියල් දශ ලක්ෂ 22.0 වටිනා කැනේඩියානු පිටි සහ රුපියල් දශ ලක්ෂ 3.0 ක් වටිනා භාණ්ඩ වශයෙන් ලැබුණු වෙනත් ද්‍රව්‍ය අඩුකර ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුව

## නිවේදනයයි

## විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය

1968 මැයි මස 6 වැනි දින සිට ක්‍රියාත්මකවීම සඳහා විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමයක් ඇති කිරීමට ලංකාණ්ඩුව තීරණය කර ඇත. මෙම ක්‍රමය යටතේ, සමහර භාණ්ඩ හා සේවා අපනයනය කිරීම වෙනුවෙන් හා පහත තුන් වන ඡේදයේ සඳහන් කර ඇති අන්දමේ මෙරටට කෙරෙන සමහර මුදල් එවීම් මගින් ලැබෙන විදේශීය විනිමය, වෙළෙඳ බැංකු වෙත බාර දෙන්නන්ට විදේශීය විනිමය හිමිකම් සහතික ( මින් මතු සහතික වශයෙන් හඳුන් වන ) නිකුත් කරනු ලැබේ. මෙයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව සහතික අලෙවිය සඳහා සතිපතා ටෙන්ඩර කැඳවනු ලැබේ. මෙම සහතික දරන්නෝ, සමහර වර්ගවල ආනයන වලට ගෙවීමට හා වෙනත් අන්දමේ මුදල් යැවීම් ( ආනයන හා විනිමය පාලන අවශ්‍යතාවලට යටත්ව ) සඳහා අවශ්‍ය වන විදේශීය විනිමය, සම මුහුණත වටිනාකමක් ඇති සහතික බාරදීම මගින් වෙළෙඳ බැංකුවලින් ඒවායේ අලෙවි අනුපාතයට විදේශීය විනිමය මිලදී ගැනීමට හිමිකාරයෝ වන්නෝය.

2. ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ නියෝජිතයා වශයෙන් මෙම සහතික නිකුත් කිරීමේ වගකීම දරන්නේය. සහතිකවල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ අත්සන නියමාකාරයෙන් ඇත. මහ බැංකුව, එය වෙනුවෙන් මෙම සහතික නිකුත් කිරීමට, කොළඹ පිහිටි වෙළෙඳ බැංකුවලට බලය දී තිබේ. සහතික නිකුත් කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ අත්සන නියමාකාරයෙන් ද, එයට අමතරව නිකුත් කරන බැංකුව වෙනුවෙන් අත්සන් දෙකක් ද එම සහතිකයෙහි තිබිය යුතුය. සහතිකයක් එය නිකුත් කළ දින සිට දින තිහකට (30) නොවැඩි කාලච්ඡේදයකදී අබාධව හුවමාරු කළ හැකි අතර, එම කාලය තුළදී වෙළෙඳ බැංකුවකට බාරදිය යුතුය. එලෙස බාරදෙන ලද සහතිකය වෙනුවෙන් කරන විදේශීය විනිමය මිලදී ගැනීම, බාරදුන් දිනයේ සිට මාස හයක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. සහතික රු. 50,000, රු. 10,000, රු. 5,000, රු.1,000 හා රු. 500 අගය කොටස් වලින් ලබාගත හැකිය. රුපියල් 500 කට අඩු අගයන් සඳහා ද වෙළෙඳ බැංකු විසින් සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ. අවශ්‍යතන්හි දී හා විශේෂ තත්ත්වයන් යටතේ ටෙන්ඩර් ක්‍රමයට වෙනස් අන්දමට සහතික නිකුත්කිරීමට ද වෙළෙඳ බැංකුවලට බලය පවරා ඇත. වෙළෙඳ බැංකු ඉල්ලීමක් ඇති විට, සහතික උප කොටස් වලට බෙද නිකුත් කරනු ලබන්නේය.

**3. සහතික සඳහා සුදුසු වන විදේශීය විනිමය ලැබීම් —**

(අ) තේ, රබර්, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා සහ ගෙඩිපොල් හැරෙන්නට අනෙක් අපනයන වලින් ( නැ. වි. ස. අගය ) ලැබීම්.

(ආ) ආයෝජන ආදායම, නඩත්තු කිරීම සඳහා මුදල් එවීම්, රටට එන්නන්ගේ මාරුකිරීම්, බුදල් උරුමකම්, අන්තිම කැමති පත්‍ර උරුමය, ප්‍රවේණි උරුමය, ත්‍යාග මුදල්, මෙරටට ප්‍රාග්ධන මාරුකිරීම්, වෘත්තීය හා රැකියා ආදායම, කොමිස් මුදල්, නියෝජන වියදම් හා කලින් කල නිවේදනය කරන වෙනත් විවිධ ශීර්ෂ, ( මෙරටට එවන මුදල් වල මුළු අගය වෙනුවෙන් ) යන විදේශීය විනිමය ලැබීම්.

(ඇ) දේශ සංචාරකයන්ගෙන් හා ලංකාවට පිටරටින් පෙරලා පැමිණෙන වැසියන් (විදේශීය විනිමය වෙනුවෙන් දැක්විය හැකි සහතික නොමැතිව සංචාරය සඳහා ඉඩදුන් රට වැසියන් හැරෙන්නට ) බාරදෙන විදේශීය විනිමයවල මුළු අගය සඳහාකෙසේ වෙතත්, එවැනි පුද්ගලයන්, විනිමය පාලක විදේශීය විනිමය මිලදී ගැනීමට බලය දී ඇති වෙළෙඳ බැංකු හා අනෙක් පුද්ගලයන්ම, බාරදුන් විනිමය සඳහා සාමාන්‍ය අනුපාතය අනුව ගෙවීම් කරනු ලබන අතර, එයට අමතරව ඔවුන් හිමිකම් කිවහැකි සහතිකයේ මුදල් අගය ද ගෙවන්නේ ය.

**4. සහතික බාරදීම අවශ්‍ය වන විදේශීය විනිමය ගෙවීම් —**

**(1) ආනයන**

(අ) 1968 මැයි 5 වන දින අංක 2/68 දරන ආනයන පාලන නිවේදනය අනුව, ආනයන 'අ' හා 'ආ' වශයෙන් කොටස් දෙකකට බෙද ඇත. විශේෂ ආධාර බලපත්‍ර යටතේ එන වි. පො. බ. ආනයන හැරුනාම 'අ' කොටසට වැටෙන සියලු ආනයන සඳහා ගෙවීමේ දී, ගෙවීම් සඳහා යොද ගන්නා බැංකුවට, සම අගයක සහතික බාරදීම අවශ්‍ය වන්නේය.

(ආ) විවෘත පොදු බලපත්‍ර යටතේ ආනයන වලට ඉඩ දෙනුයේ ණයවරලිපි වෙනුවෙන් පමණි. එසේම ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී එහි මුළුඅගය සඳහා සහතික භාර දෙන ලෙස වෙළෙඳ බැංකුව ඉල්ලා සිටිනු ඇත.

**(2) ආනයන වලට අමතරව කරන ගෙවීම්**

එවැනි සියලු ගෙවීම් ( නිල වියදම්, අනුමත අධ්‍යාපන වියදම්, යැපුම් සඳහා මුදල් යැවීම්, සංචාරක හා අපනයන දිරි ගැන්වීමේ සමහර වියදම් හා විනිමය පාලක විසින් නිශ්චිත ලෙස නිදහස් කරන වැය ශීර්ෂ හැර) සඳහා අගයක සහතික බාරදීම අවශ්‍යය. මෙම ගෙවීම්, දැනට ඇත්තා සේ විනිමය පාලන අනුමැතියට යටත් නමුත්, විනිමය මිළදී ගැනීමට කලින් සහතික බාරදිය යුතුය යන කොන්දේසිය ද විනිමය බලපත්‍රයේ අඩංගුය.

5. සහතික ටෙන්ඩර් මගින් විකිණීම — මහ බැංකුව ප්‍රවෘත්ති පත්‍රවල පළ කරන නිවේදනය කින් සහතික මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන්නේය. ටෙන්ඩරයේ කොන්දෙසි හා නීතිරීති ටෙන්ඩර් නිවේදනයෙන් පැහැදිලි කරනු ලැබේ.

6. එකී ක්‍රමය ලුහුඩින් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙම නිවේදනයෙන් විස්තර කර ඇත. ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විස්තරාත්මක උපදෙස් වෙළෙඳ බැංකු වෙත මහ බැංකුව විසින් නිකුත් කර ඇත. මෙම ක්‍රමය හා සම්බන්ධ යම්කිසි කරුණක් ගැන සැක ඇති අවස්ථාවන්හි දී මහජනයා මෙම බැංකු වල ආධාරය ලබාගත යුතුය.

**ජේ. ජී. පී. ජයසුන්දර,**
වැඩ බලන විනිමය පාලක.

**කේ. ගුණරත්නම්,**
වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී.

1968 මැයි මස 5 වැනි දින.